
# වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය
# வருடாந்த அறிக்கையும் நிதிக்கூற்றும்
# ANNUAL REPORT & STATEMENT OF ACCOUNTS



## 2014

පුනරුත්ථාපන අධිකාරිය
புனர்வாழ்வு அதிகார சபை
**REHABILITATION AUTHORITY**

අංක.59, ඩී.එස්.සේනානායක මාවත, කොළඹ - 08.
இல.59, டி.எஸ்.சேனாநாயக்க மாவத்தை, கொழும்பு - 08.
No.59, D.S.Senanayaka Mawatha, Colombo - 08.

# පටුන

01. පිළිගැන්වීමේ ලිපිය.

02. වාර්ෂික වාර්තාව.

03. වාර්ෂික ගිණුම්.

04. විගණකාධිපතිගේ වාර්තාව.

05. විගණකාධිපතිගේ වාර්තාව පිළිබඳ සභාපතිගේ නිරීක්ෂණ.

# පිළිගැන්වීමේ ලිපිය.

පාර්ලිමේන්තු මන්ත්‍රී සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍ය,

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමා,**

බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යංශය,

නො.146, ගාලු පාර,

කොළඹ 03.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරණ මුදල් පනත සහ1987 අංක 29 දරණ තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරී පනතේ විධිවිධාන ප්‍රකාර තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2014 දෙසැම්බර් මස 31වැනි දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා අධිකාරියේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඔබතුමා වෙත සතුටින් පිළිගන්වමි.

මෙයට - විශ්වාසී,

**සභාපති,**

පුනරුත්ථාපන අධිකාරිය.

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය,

අංක.59, ඩී. එස්. සේනානායක මාවත,

කොළඹ – 08.

## දැක්ම

පුනරුත්ථාපනය තුළින් ආර්ථික හා සාමාජීය සෞභාගය උදා කිරීම.

## මෙහෙවර

ජනවාර්ගික ගැටුම්, ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හා ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් විපතට පත් ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතය යථා තත්ත්වයට පත් කර පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ තුළින් සංවර්ධනාත්මක සමාජ ආර්ථික පරිසරයක් නිර්මාණය කිරීම.

# වාර්ෂික වාර්තාව - 2014

# තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය

**2014 වර්ෂයේ දී පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය පහත පරිදි විය.**

1. ඊ. ඒ. සමරසිංහ මහතා - සභාපති
2. ඩී.කේ. ජිනදාස මහතා - ක්‍රියාකාරී අධ්‍යක්ෂ
3. ඒ. සමුන් කලීල් මහතා - අධ්‍යක්ෂ
4. ප්‍රසන්න කිරිවත්තුඩුව මහතා - අධ්‍යක්ෂ

වර්ෂ 1987 අංක 29 දරණ පනත මගින් තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය ( පුනරුත්ථාපන අධිකාරිය ) පිහිටුවන ලදී.

ත්‍රස්තවාදී ක්‍රියා, මහජන කැළඹීම්, දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා වලින් විපතට පත් පුද්ගලයින්ට, දේපළ සහ කර්මාන්තවලට සහන සැලසීම හා පුනරුත්ථාපනය කිරීම පුනරුත්ථාපන අධිකාරියට අයත් කාර්ය භාරය වන අතර, එම කාර්යයන් පහත දක්වේ.

## (අ).ව්‍යවස්ථාපිත කාර්යයන්

(අ). ත්‍රස්තවාදී ක්‍රියා නිසා විපතට පත්වූවන්ට සහන සැලසීම.

(ආ). විනාශවූ / අලාභ හානි වූ නිවාස සහ දේපළ සඳහා අයිතිකරුවන් හට ආධාර සැපයීම.

(ඇ). විනාශ වූ /අලාභ හානි වූ නිවාස සහ දේපළවල පදිංචිව සිටි කුලී නිවැසියන්ට සහන සැලැසීම.

(ඈ). විනාශයට පත් ගොඩනැගිලි ආදිය කඩාදැමීමට හා සුන්බුන් ඉවත් කිරීමට නියෝග කිරීම.

(ඉ). අලාභහානි වූ කර්මාන්ත හෝ වාණිජමය දේපළ වෙනුවෙන් ආධාර සැපයීම.

(ඊ). විනාශ වූ / අලාභ හානි වූ දේපළ රජයට පවරා ගැනීම.

(උ). රජයට පවරාගෙන ඇති දේපළ නියමිත හිමිකරුවන්ට ආපසු පවරාදීම.

(ඌ). රජයට පවරාගෙන ඇති දේපළවලට සම්බන්ධ අයිතිකරුවන් හා කුලී නිවැසියන් අතර පැන නගින ආරවුල් නිරවුල් කිරීම.

## (ආ).වෙනත් කාර්යයන්

(අ). ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ නිවාසාධාර ලබාදීම, නැවත පදිංචි කිරීමේ දීමනා සම්බන්ධීකරණය සහ පසුවිපරම් කිරීම.

(ආ). ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වීම / තුවාල සිදුවීම / දේපළ හානි සිදු වීම වෙනුවෙන් වන්දි ගෙවීම.

(ඇ). ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපළ විනාශවීම හෝ ඒවාට අලාභහානි සිදුවීම වෙනුවෙන් වන්දි ගෙවීම.

(ඈ). විනාශ වූ / අලාභහානි වූ පූජනීය ස්ථාන පුනරුත්ථාපනය කිරීම සඳහා ආධාර සැපයීම.

(ඉ). මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් විපතට පත් පුද්ගලයින්ට වන්දි ගෙවීම.

(ඊ). නිවාස, ව්‍යාපාර හා කර්මාන්ත පුනරුත්ථාපනය සඳහා ණය පහසුකම් සැපයීම.

(උ). යුධ වැන්දඹුවන් සඳහා ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(ඌ). යුද්ධයේ බලපෑමෙන් අසරණභාවයට පත් වූ පාසල් යන වයසේ දරුවන්ට ආධාර ලබාදීම.

(එ). ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(ඒ). නිවාස ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

(ඔ). පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ක්‍රියාත්මක ස්වයං රැකියා ණය ක්‍රමය.

(ඕ). ග්‍රාමීය පුනරුත්ථාපන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

## (ඇ). ක්‍රියාකාරකම් විස්තර කිරීම.

### 1. ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය. (නිවාස ආධාර ලබාදීම)

තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය සහ එහි වර්තමාන අමාත්‍යංශය වන බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචිකිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යංශය විසින් ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් අවතැන් වූ තැනැත්තන් නැවත පදිංචි කිරීම හා පුනරුත්ථාපනය සඳහා ආධාර ප්‍රදානය කිරීම වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන වැඩ සටහන හඳුන්වන්නේ "ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය" යනුවෙනි. මෙම යෝජනා ක්‍රමය හදිසි පුනරුත්ථාපන හා ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ 1983 වර්ෂයේ

දී සකස් කරන ලද අතර, සපයන ආධාර වැඩි කිරීම සඳහා 1994 සහ 2002 වර්ෂවලදී දෙවරක්ම අදාළ වෙනස්කම් සිදුකරන ලදී. 2003.03.06 දින සිට මේ යටතේ ලබාදෙන නිවාසධාර මුදල් රු.100,000.00 දක්වා වැඩිකර ඇත.

පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010 වර්ෂයේදී ගන්නා ලද තීරණයකට අනුව ඉහත ආධාර මුදල රු.50,000.00 බැගින් වාරික දෙකකින් අවතැන්වූවන්ගේ විනාශ වූ නිවාස නැවත ඉදිකර ගැනීම සඳහා ලබාදෙන ලදී.

◈ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පවුල් 241 ක් වෙනුවෙන් රු.11,995,500.00 ක මුදලක් ගෙවන ලදී. මෙම සියළු පවුල් ප්‍රධාන වශයෙන් තෝරා ගැනෙනුයේ උතුරු නැගෙනහිර පළාත් වලිනි.

2. වන්දි / මූල්‍යමය ආධාර

2:1 <u>මරණ හා තුවාල වෙනුවෙන් වන්දි ගෙවීම.</u>

a). <u>රජයේ සේවක වන්දි.</u>

i) මරණ වන්දි.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා / කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් රාජ්‍ය / සංස්ථා / සමූපකාර / අධිකරණ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සාමාජිකයෙකුගේ මරණයකදී ඔහුගේ යැපෙන්නන්ට රු:200,000.00 උපරිමයකට යටත්ව වන්දි ගෙවනු ලැබේ.මෙය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88 , 59/89 හා ඊට සංශෝධිත චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ.

◈ සමාලෝචිත කාල පරිච්ඡේදය තුල මියගිය පුද්ගලයින් 07 දෙනෙකු වෙනුවෙන් රු:1,000,000.00 ක මුදලක් ගෙවීම් කර ඇත.

ii) තුවාල වන්දි.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා / කඩාකප්පල්කාරී ක්‍රියා හේතුවෙන් රාජ්‍ය / සංස්ථා / සමූපකාර / අධිකරණ හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ ලියාපදිංචි පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හට සිදුවූ තුවාල සඳහා රු:100,000.00 උපරිමයකට යටත්ව වන්දි ගෙවනු ලබයි. උපරිම වන්දි මුදල, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් පත්කරනු ලබන වෛද්‍ය මණ්ඩල වාර්තාවට අනුව

ඉපැයීමේ හැකියාව හීනවූ ප්‍රතිශතය පදනම් කර ගනිමින් තිරණය කරනු ලැබේ.

මෙය රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88 , 59/89 හා ඊට සංශෝධිත චක්‍රලේඛ ප්‍රකාරව ගෙවනු ලැබේ.

◈ සමාලෝචිත කාල පරිච්ඡේදය තුල තුවාල ලත් පුද්ගලයින් 06 දෙනෙකු වෙනුවෙන් රු:200,000.00 ක මුදලක් ගෙවීම් කර ඇත.

විශේෂ ශ්‍රේණියේ පුද්ගල වන්දි.

(i) මරණ වන්දි.

මෙම යෝජනා ක්‍රමය යටතේ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතු කොටගෙන ඇමතිවරුන්ගේ හා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ, පළාත් සභා ඇමතිවරුන්ගේ හා මන්ත්‍රීවරුන්ගේ, ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා පවත්වන ලද මැතිවරණයක දී තේරීපත් නොවූ අපේක්ෂකයන්ගේ මරණයකදී ඔවුන්ගේ ආසන්නතම ඥාතීන්ට උපරිමය රු.500,000.00 ක යටත්ව උපරිම වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

(ii) තුවාල වන්දි.

ඉහත සඳහන් විශේෂ ශ්‍රේණියේ පුද්ගලයින්ට තුවාල සිදුවූ අවස්ථාවක දී රජයේ දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී වාර්තාවට අනුව උපරිමය රු:500,000.00 ක වන්දි මුදලක් ලැබීමට හිමිකම් තිබේ.

◈ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර නොමැත.

b) බලවත්සේ විපතට පත්වූවන් සඳහා වූ වන්දි ක්‍රමය.

ත්‍රස්තවාදී ක්‍රියා, ජනවාර්ගික ගැටුම්, මහජන කැළඹීම් සහ ආරක්ෂක මෙහෙයුම් හේතුකොට මියගිය තැනැත්තන්ගේ යැපෙන්නන් හට හෝ ඒ හේතුවෙන් තුවාල ලැබූවන්ට හෝ මෙම වන්දි ක්‍රමය යටතේ පහත සඳහන් පරිදි වන්දි ලැබීමට හිමිකම් තිබේ.

- මරණයකදී රු.100,000.00

◈ සමාලෝචිත කාල පරිච්ඡේදය තුල මෙම වන්දි යෝජනා ක්‍රමය යටතේ මියගිය පුද්ගලයින් 1387 දෙනෙකු වෙනුවෙන් රු:138,477,500.00 ක මුදලක් ගෙවීම් කර ඇත.

- තුවාල සිදුවීමකදී උපරිම මුදල රු. 50,000.00

( මෙම මුදල දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී විසින් නිකුත් කරන ඉපයිමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය මත තීරණය වේ.)

◈ සමාලෝචිත කාල පරිච්ඡේදය තුල මෙම වන්දි යෝජනා ක්‍රමය යටතේ තුවාල ලැබූ පුද්ගලයින් 332 දෙනෙකු වෙනුවෙන් රු:10,262,250.00 ක මුදලක් ගෙවීම් කර ඇත.

## 2.2 හානි වූ / විනාශ වූ පෞද්ගලික දේපළවෙනුවෙන් වන්දි ගෙවීම.

### (a). රජයේ/ රාජ්‍ය සංස්ථා සේවකයින්ට වන්දි ගෙවීම.

1987 ජුලි / අගෝස්තු මාස වලදී සහ ඉන්පසුව ඇති වූ ත්‍රස්තවාදී විපත් වලින් හානි වූ දේපළ වෙනුවෙන් රු.150,000.00 ක උපරිමය දක්වා වන්දි මුදලක් ලැබීමට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 49/89 යටතේ රජයේ සේවකයන්ට / සංස්ථා සේවකයන්ට හිමිකම් තිබේ.

◈ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයන් 503 වෙනුවෙන් රු.65,542,203.00 ක මුදලක් ගෙවන ලදී.

### (b). විශේෂ පුද්ගලයන්ට වන්දි ගෙවීම.

ඇමතිවරුන්ට, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට,පළාත් සභා ඇමතිවරුන්ට හා ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තු, පළාත් සභා පළාත් පාලන මැතිවරණ වලදී තේරිපත් නොවූ අපේක්ෂකයන්ට අයත් අලාභ හානි වූ / විනාශයට පත්වූ දේපළ වෙනුවෙන් පිළිවෙලින් රු.500,000.00 සහ රු.150,000.00ක උපරිමයකට යටත්ව වන්දි ගෙවීමට මෙමගින් ප්‍රතිපාදන සලසා ඇත.

◈ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර නොමැත.

### (c). සාමාන්‍ය මහජනයා සඳහා වන්දි ගෙවීම.

ඉහත සඳහන් යෝජනා ක්‍රම දෙක යටතේ ආධාර ලැබීමට හිමිකම් නොමැති විපතට පත් පුද්ගලයන්ට හා ඔවුන්ගේ හානි වූ / විනාශ වූ වාහන ද ඇතුළුව, දේපළ වෙනුවෙන් අලාභයෙන් 20%ක මුදලක් උපරිමය රු.100,000.00 කට යටත්ව ගෙවීම් කරනු ලැබේ.

මෙම වන්දි යෝජනා ක්‍රමය 1983 ජූලි මාසයේ සිට ආවරණය වන පරිදි 1996.02.16 වැනි දින සිට ක්‍රියාත්මක කෙරේ.

◊ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 987 දෙනෙකුට වන්දි වශයෙන් රු.76,619,559.00ක මුදලක් ගෙවන ලදී.

**(d). 2006 ජනවාරි මස බේරුවල දර්ගා නගරයේ සිදුවූ ජාතිවාදී කලබලය නිසා හානියට පත් දේපළ සඳහා වන්දි ලබා දීම.**

ඉහත සිද්ධියට අදාළව හානියට පත් දේපළ අයිති පුද්ගලයන් 08 දෙනෙකු සඳහා කැබිනට් අනුමැතිය පරිදි වන්දි ලබාදීමට පුනරුත්ථාපන අධිකාරිය පියවර ගන්නා ලදි . නැවත පදිංචි කිරිමේ හා ආපදා සහන සේවා අමාත්‍යාංශය මඟින් පත් කරනු ලැබූ විශේෂ කමිටුවේ නිර්දේශ වලට අනුකූලව මෙම වන්දි ලබාදීම සිදුකරනු ලැබුනි . උපරිම හා සාධාරණ වන්දි මුදලක් ලබාදීමට පුනරුත්ථාපන අධිකාරිය කටයුතු කරනු ලැබීය . ඒ යටතේ සමාලෝචන වර්ෂය තුල පුද්ගලයන් 81 දෙනෙකු සඳහා රු.19,104,119.00 ක මුදලක් ලබා දෙන ලදී .

### 2.3 හානියට පත් පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම.

ත්‍රස්තවාදී ක්‍රියා නිසා අලාභහානි වූ / විනාශයට පත් වූ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආධාර දෙනු ලැබේ. මුළුමනින්ම විනාශ වූ පූජනීය ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සඳහා උපරිමය රු.1,000,000.00ක් ද, කොටසක් විනාශ වූ ස්ථාන සඳහා උපරිමය රු.500,000.00ක් ද ගෙවීම් කරනු ලැබේ.

◊ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ පූජනීය ස්ථාන 213ක් සඳහා වන්දි වශයෙන් රු.20,007,312.00 ක මුදලක් ගෙවන ලදී.

## 3. විවාහ සමෘද්ධි දීමනා.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් රජයේ සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන අතරතුර දී විවාහපත් වන පුද්ගලයෙකුට රු.12,500.00ක ආධාර මුදලක් ලැබීමට හිමිකම් තිබේ. සුළු පරිමාණයේ ආදායම් උපදවන ආර්ථික කටයුතු ඇරඹීමට යථෝක්ත යෝජනා ක්‍රමය යටතේ ඉහත ආධාර සපයනු ලැබේ. විවාහපත් වන යුවල රජය විසින් නඩත්තු කරන ලබන සුභ සාධක මධ්‍යස්ථානයක ජීවත් වන තැනැත්තන් වේ නම් එම ආධාර මුදල දෙගුණ වී ඔවුන්ට රු.25,000.00ක මුදලක් ගෙවනු ලැබේ.

මෙම යෝජනා ක්‍රමය 1995 වර්ෂයේ ජූලි මාසයේ දී හඳුන්වා දෙන ලදී.

◊ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ වන්දි ගෙවීම් සිදුකර නොමැත.

## 4. පුනරුත්ථාපන ණය යෝජනා ක්‍රම.

### i. ස්වයං රැකියා ණයලාභීන් සඳහා පුහුණු වැඩසටහන

2012 වර්ෂයේ සිට මෙම වසරේ අවසානය දක්වා යුද්ධය නිසා විපතට පත් ( මරණ / තුවාල / වැන්දඹු හෝ ආර්ථික වශයෙන් ) සාමාන්‍ය ජනතාව සඳහා හා පුනරුත්ථාපනය වු අභ්‍යාසලාභීන් සඳහා ක්‍රියාත්මක ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යටතේ තෝරාගත් ණය ප්‍රතිලාභීන් සඳහා ව්‍යවසාය සංවර්ධන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක විය . ඒ යටතේ තෝරාගත් ණයලාභීන් 2039 ක් පුහුණු කිරීම සඳහා පුහුණු වැඩමුළු 16 ක් සමාලෝචිත වර්ෂය තුල පවත්වන ලදී. ඒ සඳහා රුපියල් 1,056,755.00 ක් වැය කොට ඇත.

### ii කර්මාන්ත ණය.

ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ ඒ ආශ්‍රිත ක්‍රියා හේතුවෙන් හානියට පත් ලියාපදිංචි කර්මාන්ත නැවත ආරම්භ කිරීම සඳහා 9% ක පොළී අනුපාතයක් සහ ආපසු අයකර ගැනීමේ කාලය අවුරුදු 10 කට යටත්ව එක් කර්මාන්තයකට රුපියල් මිලියන 05ක උපරිමයකට යටත්ව ණය මුදලක් ගෙවනු ලැබේ. ණය මුදල් ගෙවීම සහ ආපසු අයකර ගැනීම ලංකා බැංකුව විසින් සිදු කරනු ලබයි.

◊ සමාලෝචිත වර්ෂය තුල දී ඉහත යෝජනා ක්‍රමය යටතේ එක් කර්මාන්තයක් සඳහා රු. 2,500,000.00 ක මුදලක් නිදහස් කර ඇත.

### iii ස්වයං රැකියා ණය ක්‍රමය

ත්‍රස්තවාදී ක්‍රියා / යුධමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් හා යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වූවන් සඳහා ආධාර සැපයීම උදෙසා මෙම ණය යෝජනා ක්‍රමයට 2010 වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී.මේ සඳහා 4% ක සහනදායී පොළී අනුපාතයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර 10ක උපරිමයට හා එක් වසරක ණය සහන කාලයකට යටත් ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකුට ලබා ගත හැකි උපරිම ණය මුදල රු.250,000.00 කි. මෙම ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය ප්‍රධාන වශයෙන් උපයෝගී කර ගනු ලබන්නේ උතුරු නැගෙනහිර පළාත් සඳහාය.

- සමාලෝචිත වර්ෂය තුල දී පහත සඳහන් පරිදි ණය නිදහස් කර තිබුණි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගෙවූ සංඛ්‍යාව | ගෙවූ මුදල රු |
|---|---|---|---|
| 1 | වවුනියාව | 48 | 6,480,000.00 |
| 2 | මන්නාරම | 46 | 7,400,000.00 |
| 3 | කිලිනොච්චිය | 10 | 1,375,000.00 |
| 4 | මුලතිව් | 44 | 6,310,000.00 |
| 5 | යාපනය | 62 | 7,875,000.00 |
| 6 | මඩකලපුව | 80 | 10,555,000.00 |
| 7 | ත්‍රිකුණාමලය | 31 | 4,145,000.00 |
| 8 | අම්පාර | 112 | 13,709,000.00 |
| 9 | අනෙකුත් දිස්ත්‍රික්ක | 1 | 200,000.00 |
|  | එකතුව | 434 | 58,049,000.00 |

iv. <u>නිවාස ණය ක්‍රමය.</u>

ත්‍රස්තවාදී ක්‍රියා / යුදමය තත්ත්වයන් යටතේ විවිධ අයුරින් පීඩාවට පත් පුද්ගලයින් වෙනුවෙන් සහ යුද්ධය හේතුවෙන් වැන්දඹුවන් බවට පත්වූවන් නැවත පදිංචි කිරීම සහ ඔවුන්ගේ නිවාස වැඩිදියුණු කරගැනීමට ආධාර සැපයීම උදෙසා මෙම ණය යෝජනා ක්‍රමයට 2010වසරේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දෙන ලදී. මේ සඳහා 4% ක සහනදායී පොළී අනුපාතිකයක්, ණය ආපසු ගෙවීමේ කාලය වසර 10ක උපරිමයකට හා එක් වසරක ණය සහන කාලයක ට යටත්ව මෙම ණය යෝජනා ක්‍රමය යටතේ පුද්ගලයෙකුට ලබා ගත හැකි උපරිම ණය මුදල රු.250,000.00කි.

- 2014 වර්ෂය තුලදී මෙම නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ අයදුම්කරුවන් 73 දෙනෙකු වෙනුවෙන් රු 17,700,000.00 ක මුදලක් නිවාස ණය වශයෙන් පහත පරිදි නිදහස් කර තිබුනි .

v. <u>පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ක්‍රියාත්මක ස්වයං රැකියා ණය ක්‍රමය.</u>

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය යටතේ පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් උදෙසා ස්වයං රැකියා සහන ණය යෝජනා ක්‍රමය 2012.01.31 දිනැතිව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කල අතර එය පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යංශයේ ලේකම්තුමාගේ 2012.04.25 දිනැති චක්‍රලේඛය මඟින් පහත සහනයන් හිමි වන පරිදි නිකුත් කරන ලදී.

i. අනුමත කළ හැකි උපරිම මුදල රු.250,000.00 කි.

ii. වාර්ෂික පොළිය 4% කි.

iii. වසරක සහන කාලයකි.

iv. අය කර ගැනීමේ කාලය වසර 10 කි.

මෙම ණය ක්‍රමය පුනරුත්ථාපන අධිකාරිය හා පහත මුල්‍ය ආයතන ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලැබේ.

i. ලංකා බැංකුව
ii. මහජන බැංකුව
iii. ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව

◊ 2014 වර්ෂය තුලදී නිදහස් කල ණය සංඛ්‍යාව ස්වයං රැකියා මට්ටමින් පහත පරිදිය.

| අනු අංකය | ස්වයං රැකියා කාණ්ඩය | ණය සංඛ්‍යාව | ගෙවූ මුදල රු. |
|---|---|---|---|
| 1 | කෘෂි කර්මාන්තය | 1 | 100,000.00 |
| 2 | සත්ව පාලනය | 7 | 1,150,000.00 |
| 3 | ධීවර කර්මාන්තය | 8 | 1,615,000.00 |
| 4 | කුඩා ව්‍යාපාර | 6 | 925,000.00 |
| 5 | ගෘහාශ්‍රිත කර්මාන්ත | 1 | 100,000.00 |
| 6 | නිෂ්පාදන උපකරණ මිලදී ගැනීම | 1 | 100,000.00 |
| 7 | වාහන මිලදී ගැනීම | 1 | 200,000.00 |
| | එකතුව | 25 | 4,190,000.00 |

**vi** ණය පසු විපරම් වැඩසටහන

පුනරුත්ථාපන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ණය යෝජනා ක්‍රමයන්ට අදාලව විශේෂයෙන් වැන්දඹු පවුල් සඳහා ණය පසුවිපරම් වැඩසටහන ක්‍රියාත්මක වේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා නිවාස 1312 ක් සඳහා වැයවූ මුදල රු.1,361,427.06 කි

**5.** ග්‍රාමීය පුනරුත්තාපන යෝජනා ක්‍රමය

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු චන්ද්‍රසිරි ගජධීර අමාත්‍යතුමාගේ මඟපෙන්වීම යටතේ රේබිය අමාත්‍යාංශ ඒකාබද්ධ කිරීමෙන් යුද්ධයෙන් විනාශයට පත් ගම්මානවල ජනතාව සඳහා සහන ලබාදීම මේ යටතේ සිදුකෙරේ.

- මුලතිව් , මල්ලාවි , නාට්ටන්කන්ඩාල් හි රු 441,659.80 ක් වටිනා ඖෂධ බෙදා දීම.
- නාට්ටන්කන්ඩාල් දිස්ත්‍රික් රෝහල් මුළුතැන්ගෙය සඳහා රු 29,500.00 ක මුදලක් ලබා දීම.
- රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව මඟින් රු 44,782.20 වටිනා ඖෂධ ලබා දීමට කටයුතු කිරීම.

- වාකරේ,මඩකලපුව පලාවුවනයි , මරිටයිම්පත්තු මුලතිව් හා පාච්චිලායිපලෙයි යන ප්‍රදේශ සඳහා කජු පැල බෙදා දීම සඳහා රු.300,000.00 ක් ලබා දිම .
- කණ්ඩාවලෙයි කාන්චිපුරම් ග්‍රාමයට ක්‍රීඩා උපකරණ මිලදී ගැනිම සඳහා රු 25,850.00 ක් ලබා දිම හා ක්‍රිඩා උපකරණ අළුත්වැඩියා කිරිම සඳහා රු.51,750.00 ක මුදලක් ලබා දීම.
- වැලිඔය , ජනකපුර ගම්මානයේ ශිෂ්‍යයන් 100 දෙනෙකු සඳහා පාපැදි 100 ක් ලබා දීමට රු 200,000.00 ක මුදලක් ලබාදීම.
- කන්චිපුරම්, කණ්ඩාවෙලි ගම්මානයේ කොටසක් විනාශ වූ නිවාස 60ක් අලුත්වැඩියා කිරිම සඳහා වූ රු.3,100,000.00 මුදලක් ලබා දීම.

## 6. පුනරුත්ථාපන අධිකාරියේ කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වීම් ලබා දීම.

පුනරුත්ථාපන අධිකාරියේ පහළ සිට ඉහළ ශ්‍රේණි දක්වා නිලධාරීන් සඳහා පරිගණක ,මානව සම්පත් කළමණාකරණය , භාෂා , තාක්ෂණික අධ්‍යාපන පොදු සේවා හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණුවීම් ලබා දීමට කටයුතු කරනු ලැබේ. ආයතනයේ සේවා ඵලදායිතාව හා කාර්යක්ෂමතාව වර්ධනය කිරිම මෙම පුහුණු වැඩසටහන් වල අරමුණ වේ.2014 වර්ෂය තුලදී සියලු පුහුණු වැඩසටහන් සඳහා රු.1,107,680.00 ක මුදලක් වැය කර තිබුණි .

**එන්.පත්මනාදන්**
සභාපති

**පුනරුත්ථාපන අධිකාරිය**
**අංක.59, ඩී. එස්. සේනානායක මාවත,**
**කොළඹ 08.**

## රාජ්‍ය අංශ අස්තිත්වය - මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය **2014 දෙසැම්බර් 31 දිනට**

| | සටහන් | 2014 රු: ශත | 2013 රු: ශත |
|---|---|---|---|
| වත්කම් | | | |
| ජංගම වත්කම් | | | |
| තොගය | 1 | 695,995.00 | 442,442.00 |
| ණය අය කිරීම් | 2 | 3,577,721.00 | 73,437,945.00 |
| සේවක ණය | 3 | 13,752,594.00 | 13,702,815.00 |
| සේවක පාරිතෝෂික ආයෝජන | 4 | 10,766,894.00 | 5,875,222.00 |
| අත්තිකාරම්, ගෙවීම් සහ වෙනත් ලැබීම් | 5 | 14,145,685.00 | 50,803,077.00 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 6 | 1,502,868.00 | 16,728,294.00 |
| | | 44,441,757.00 | 160,989,795.00 |
| ජංගම නොවන වත්කම් | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 7 | 21,687,724.00 | 242,757,492.00 |
| දිගු කාලීන ආයෝජන | 8 | 883,630,000.00 | 868,865,242.00 |
| පරිගණක දත්ත පද්ධතිය | 9 | 2,688,000.00 | - |
| | | 908,005,724.00 | 1,111,622,734.00 |
| මුළු වත්කම් | | 952,447,481.00 | 1,272,612,529.00 |
| බැරකම් | | | |
| ජංගම බැරකම් | | | |
| වෙනත් ගෙවිය යුතු දෑ | 10 | 906,775.00 | 2,296,495.00 |
| | | 906,775.00 | 2,296,495.00 |
| ජංගම නොවන බැරකම් | | | |
| වෙන් කිරීම් සහ වෙනත් බැරකම් | 11 | 738,844,380.00 | 738,994,380.00 |
| විශ්‍රාමික පාරිතෝෂික අරමුදල | | 10,766,894.00 | 9,348,397.00 |
| | | 749,611,274.00 | 748,342,777.00 |
| මුළු බැරකම් | | 750,518,049.00 | 750,639,272.00 |
| ශුද්ධ වත්කම් | | 201,929,432.00 | 521,973,257.00 |
| ශුද්ධ වත්කම් / ස්කන්ධය | | | |
| රාජ්‍ය ප්‍රදාන | | - | 218,996,000.00 |
| ප්‍රත්‍යාගණනය මත අතිරික්තය | | 15,059,772.00 | 6,530,642.00 |
| සමුච්චිත අතිරික්කය | | 177,036,745.00 | 296,446,615.00 |
| මුළු ස්කන්ධය / බැරකම් | | 192,096,517.00 | 521,973,257.00 |

**සහතිකකිරීම**

4 දෙසැම්බර් 31 දින දක්වා ආයතනයේ අතිරික්ත/හිඟ පිලිබඳ මූල්‍ය ප්‍රකාශනය නිවැරදි හා සාධාරණ බව සනාථ කරමු.

---------------------------

**එස්.එන්.සී.ඩබ්.එම්.ධර්මකීර්ති**
**(සහකාර අධ්‍යක්ෂ, මුදල්)**

මෙම මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ පූර්ණ බලතල අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරේ. මෙම මූල්‍ය ප්‍රකාශය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කර ඇත .

| | | |
|---|---|---|
| **එන්. පත්මනාදන්** (සභාපති) | **එන්. පුගේන්ද්‍රන්** (ක්‍රියාකාරී අධ්‍යක්ෂ) | **එන් .ආර් .රංජනී** (ලේකම්) |

( පුනරුත්ථාපන නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය )

## රාජ්‍ය අංශ අස්තිත්වය - මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| අයභාර | සටහන් | 2014<br>රු. ශත | 2013<br>රු. ශත |
|---|---|---|---|
| පුනරාවර්තන ප්‍රදාන | 1 | 365,347,000.00 | 237,029,000.00 |
| පොළී | 2 | 16,657,400.22 | 13,948,205.53 |
| වෙනත් අයභාර | | 10,200.00 | 17,625.00 |
| අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලද ලාභ/පාඩු | | - | [71,853.21] |
| මුළු අයභාර | | **382,014,600.22** | **250,922,977.32** |
| වියදම් | | | |
| වැටුප්,වේතන සහ සේවක වරප්‍රසාද | 3 | 33,149,376.84 | 26,663,773.22 |
| ප්‍රදාන සහ වෙනත් සංක්‍රාම ගෙවීම් | 4 | 319,441,211.61 | 193,893,757.99 |
| සැපයුම් සහ පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 5 | 1,450,410.29 | 3,539,902.33 |
| ක්ෂයවීම් | 6 | 5,069,038.83 | 3,718,248.24 |
| බොල්ණය | 7 | 11,999,500.00 | - |
| අඩමාණ ණය | 8 | 108,056,142.74 | - |
| ස්ථාවර වත්කම් නඩත්තුව | 9 | 3,254,944.97 | 2,639,710.10 |
| වෙනත් වියදම් | 10 | 18,413,282.83 | 12,832,277.70 |
| මූල්‍ය වියදම් | 11 | 442,505.87 | 216,980.58 |
| මුළු වියදම් | | **501,276,413.98** | **243,504,650.16** |
| කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය / ඌනතාවය | | **[ 119,261,813.76]** | **7,418,327.16** |

තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය
2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| විස්තරය | සටහන් | 2014 (රු.) |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහයන්** | | |
| මහා භාණ්ඩාගාරයෙන් ලද අක්මුදල් | | 365,347,000.00 |
| විවිධ ආදායම් | | 10,200.00 |
| වෙනත් පුනරාවර්තන වියදම් | ඒ | [375,770385.23] |
| ස්ථිර නිවාස ආධාර | | [11,999,500.00] |
| මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ප්‍රවාහ | | **[22,412,685.23]** |
| **ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහ** | | |
| පොළී ආදායම | බී | 15,377,023.34 |
| ණය අයකර ගැනීම් | සී | 9,904,874.57 |
| ස්ථාවර වත්කම් මිල දී ගැණුම් | ඩී | [7,416,490.71] |
| කල් පිරුණු ආයෝජන ආපසු ගැනීම් | ඊ | 53,235,242.00 |
| ආයෝජන | එෆ් | [83,613,389.94] |
| ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහ | | **[12,512,740.74]** |
| මූල්‍යමය ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ මුදල් ප්‍රවාහය | | **19,700,000.00** |
| මහා භාණ්ඩාගාරයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදාන | | **19,700,000.00** |
| මුදල් සහ මුදල් සමාන දෑ - ශුද්ධ වැඩිවීම/අඩුවීම | | **[15,225,425.97]** |
| කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | ජී | **16,728,294.32** |
| කාල පරිච්ඡේදය අවසානයේදී මුදල් සහ මුදල් සමාන දෑ | එච් | **1,502,868.35** |

* ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය වාර්තාවල අවශ්‍ය අංගයක් වේ.

* වරහන් තුළ ඇතුළත් සංඛ්‍යා අඩු කිරීම් වශයෙන් සැලකේ.

## රාජ්‍ය අංශ අස්තිත්වය - ශුද්ධ වත්කම් /ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

සටහන් - 11

| | සමුච්චිත අරමුදල | පාරිතෝෂික වෙන්කිරීම් | රජයේ ප්‍රාග්ධන ප්‍රදාන | ප්‍රත්‍යගණන සංචිතය | එකතුව |
|---|---|---|---|---|---|
| 2014 ජනවාරි 01 දිනට ශේෂය | 296,446,615.17 | 9,348,397.37 | 218,996,000.00 | 6,530,642.30 | 531,321,654.84 |
| | | | | | |
| දේපළ ප්‍රත්‍යගණන වෙන් කිරිම | | [357,696.00] | | [792,267.80] | [1,149,963.80] |
| දේපළ ප්‍රත්‍යගණන වෙන් කිරිම 2014 | | | | 9,321,397.78 | 9,321,397.78 |
| වර්ෂයට අදාළ වෙන් කිරීම් (ශුද්ධ) | | 1,776,192.33 | 19,700,000.00 | | 21,476,192.33 |
| | | | [228,863,085.00] | | [228,863,085.00] |
| පෙර වර්ෂවල වියදම | [182,712.98] | | | | [182,712.98] |
| පෙර වර්ෂවල ආදායම | 34,656.00 | | | | 34,656.00 |
| කාලපරිච්ඡේදය සඳහා වූ අතිරික්තය /ඌනතාවය | [119,261,813.76] | | | | [119,261,813.76] |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 177,036,744.43 | 10,766,893.70 | 9,832,915.00 | 15,059,772.28 | 212,696,325.41 |

## 2014

| ලංකා බැංකුව රු 25.000 සහ රු 10,000 බොල් ණය සටහන | | | |
|---|---|---|---|
| විස්තරය | රු 25.000 ණය | රු 10.000 ණය | රු 200,000.00 ණය |
| වැය<br>2014.01.01 දිනට ශේෂය<br>එකතුකිරීම් | 67,341,609.58 | 9,289,484.54 | 4,472,151.03 |
| 2014.12.31 දිනට ශේෂය | **67,341,609.58** | **9,289,484.54** | **4,472,151.03** |
| ලැබීම්<br>2014.01.01 දිනට ශේෂය | 6,736,352.14 | 928,948.45 | - |
| 2014 වර්ෂය සඳහා බොල්ණය | 60,605,257.44 | 8,360,536.09 | 894,430.21 |
| **2014.12.31 දිනට ශේෂය** | **67,341,609.58** | **9,289,484.54** | **894,430.21** |
| | | | |
| 2014.12.31 දිනට ශුද්ධ පොත් අගය | | | 3,577,720.82 |

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සවිස්තරාත්මක මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

| 2013 (රු.) | සටහන් | | 2014 (රු.) |
|---|---|---|---|
| | | වත්කම් | |
| **442,442.03** | 1 | තොග ප්‍රමාණය | **695,994.67** |
| 442,442.03 | | තොගය ලිපි ද්‍රව්‍ය | 695,994.67 |
| **73,437,944.56** | 2 | ණය අය කිරීම් | **3,577,720.82** |
| 4,472,151.03 | | රු. 200,000.00 ලංකා බැංකු ව්‍යාපාරික ණය | 4,472,151.03 |
| 67,341,609.58 | | රු. 25,000.00 ලංකා බැංකු දේපළ යථාවත් කිරීමේ ණය | 67,341,609.58 |
| 9,289,484.54 | | රු. 10,000.00 ලංකා බැංකු ස්වයං රැකියා ණය | 9,289,484.54 |
| | | | **81,103,245.15** |
| | | අඩු කලා - වෙන් කිරීම් | |
| | | අඩ කලා බොල්ණය ලංකා බැංකු ව්‍යාපාරික ණය 20% | 894,430.21 |
| [6,736,352.14] | | ලංකා බැංකු දේපළ යථාවත් කිරීමේ ණය රු. 25,000.00 | 67,341,609.58 |
| [928,948.45] | | රු. 10,000.00 ලංකා බැංකු ස්වයං රැකියා ණය | 9,289,484.54 |
| | | 2014.12.31 දිනට ඉතිරිය | |
| **13,702,815.41** | 3 | සේවක ණය | **13,752,593.61** |
| 8,722,048.26 | | දේපළ ණය | 7,782,228.78 |
| 4,880,524.70 | | ආපදා ණය ( දසමස වැටුප් ණය) | 5,890,622.38 |
| - | | ගංවතුර අත්තිකාරම් | - |
| 100,242.45 | | උත්සව අත්තිකාරම් | 79,742.45 |
| 5,875,222.01 | 4 | සේවක පාරිතෝෂික ආයෝජන | 10,766,893.70 |
| 5,875,222.01 | | සේවක පාරිතෝෂික ආයෝජන | 10,766,893.70 |
| 50,803,077.06 | 5 | අත්තිකාරම්,ගෙවීම් සහ වෙනත් ලැබීම් | 14,145,684.51 |
| 44,911,247.51 | | ණයදෙන ආයතනවලින් ලැබිය යුතු පොලී | 46,242,606.12 |
| | | අඩු කලා නිවාස අධිකාරියේ පාරිතෝෂික වලින් ලැබිය යුතු පොලී | [38,195,919.00] |
| | | | 8,046,687.12 |
| 415,196.84 | | පාරිතෝෂික ආයෝජන වලින් ලැබිය යුතු පොලී | 336,304.22 |
| 208,538.56 | | ලැබිය යුතු ලැබීම් | 292,398.31 |
| 254,801.48 | | පෙර - ගෙවුම් | 290,673.87 |
| 28,292.67 | | අයවිය යුතු වැටුප් | 120,565.15 |
| 4,985,000.00 | | ආපසු ගෙවිය යුතු තැන්පතු | 5,059,055.84 |

| | | | | |
|---|---|---|---|---|
| 16,728,294.32 | 6 | මුදල් හා මුදල් සමාන දෑ | | 1,502,868.35 |
| | | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව ගිණුම් අංක- | | |
| 869,378.32 | | | 2026495 | 408,710.35 |
| | | ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව ගිණුම් අංක- | | |
| 313,445.37 | | | 2026496 | 313,445.37 |
| | | ලංකා බැංකුව - මෙට්‍රොපොලිටන් ශාඛාව ගිණුම් අංක - | | |
| 15,545,470.63 | | | 74757297 | 780,712.63 |
| **242,757,492.43** | 7 | දේපළ , පිරියත හා උපකරණ | | **21,687,724.43** |
| | | පිරිවැය | | |
| 26,371,050.30 | | වර්ෂයේ ආරම්භක දිනට අගය | | 26,816,845.97 |
| 4,950,000.00 | | ජර්නල් සටහන් අංක - 13 | | 13,006,880.80 |
| 1,089,939.50 | | වර්ෂය තුළ අපහරණය (අපහරණය කළ වත්කම්වල ගත් මිල) | | - |
| 13,006,880.80 | | වර්ෂය තුළ ප්‍රත්‍යගණනය ( ප්‍රත්‍යගණිත වත්කම්වල ගත් මිල) | | - |
| - | | ජර්නල් සටහන් අංක - 14 | | [4,042,999.47] |
| 5,549,616.50 | | වර්ෂය තුළ එකතු කිරීම් | | 4,723,525.71 |
| 4,042,999.47 | | එකතු කළා - වත්කම්වල ප්‍රත්‍යගණිත අගය | - | |
| | | ජර්නල් සටහන් අංක - 27 | | [1,522,660.00] |
| | | ජර්නල් සටහන් අංක - 31 | | 11,650,000.00 |
| | | ජර්නල් සටහන් අංක - 32 | | [13,839,820.00] |
| **26,816,845.97** | | | | **36,791,773.01** |
| | | ක්ෂයවීම් | | |
| 18,260,078.13 | | වර්ෂයේ ආරම්භක දිනට වයස | | 12,922,438.54 |
| 971,211.29 | | අපහරණය කළ වත්කම්වල ක්ෂයවීම් | | - |
| 9,756,149.13 | | ප්‍රත්‍යගණිත වත්කම්වල ක්ෂයවීම් | | - |
| 3,718,248.23 | | එකතු කළා - වර්ෂය සඳහා ක්ෂයවීම් | | 4,674,977.50 |
| 1,671,472.60 | | ජර්නල් සටහන් අංක - 15 | | 9,756,149.13 |
| | | ජර්නල් සටහන් අංක - 16 | | 836,063.08 |
| | | ජර්නල් සටහන් අංක - 17 | | [791,458.61] |
| | | ජර්නල් සටහන් අංක - 27 | | [1,176,964.62] |
| | | ජර්නල් සටහන් අංක - 28 | | 716,000.00 |
| | | ජර්නල් සටහන් අංක - 29 | | [321,938.67] |
| | | ජර්නල් සටහන් අංක - 33 | | [11,511,217.78] |
| 12,922,438.54 | | වර්ෂය අවසාන අගය | | 15,104,048.58 |
| | | ශුද්ධ පොත් අගය | | |
| 13,894,407.43 | | වර්ෂය අවසාන අගය | | 21,687,724.43 |
| | | ( විස්තර සඳහා සටහන් අංක 12 -1 බලන්න) | | |
| 228,863,085.00 | | නිවාස ආධාර සඳහා ප්‍රාග්ධන ප්‍රදාන | | - |
| | | එකතු කලා- | | |
| 868,865,242.00 | 8 | දිගුකාලීන ආයෝජන | | 883,630,000.00 |
| | | ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණයදෙන | | |
| 868,865,242.00 | | ආයතන වලට ලබා දුන් අරමුදල් | | 883,630,000.00 |

(විස්තර සඳහා සටහන් අංක 13 - 1 බලන්න

| | | | |
|---|---|---|---|
| | 9 | අස්පෘශ්‍ය වත්කම් | **2,688,000.00** |
| | | පරිගණක දත්ත පද්ධතිය | 2,688,000.00 |
| 1,272,612,529.82 | | මුළු වත්කම් | 952,447,480.09 |
| 2,296,494.97 | 10 | වෙනත් ගෙවිය යුතු දෑ | 906,774.68 |
| 1,565,023.67 | | උපචිත වියදම් | 865,108.68 |
| 731,471.30 | | තැන්පතු ගිණුම් | 41,666.00 |
| 738,994,380.00 | 11 | වෙන් කිරීම් සහ වෙනත් බැරකම් | **738,844,380.00** |
| 738,544,380.00 | | ඒකාබද්ධ සහනාධාර ක්‍රමය යටතේ ණය දීම සඳහා භාණ්ඩාගාරය විසින් සපයනු ලැබූ අරමුදල් | 738,544,380.00 |
| 450,000.00 | | විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් | 300,000.00 |
| **741,290,874.97** | | මුළු බැරකම් | **739,751,154.68** |
| **531,321,654.85** | | ශුද්ධ වත්කම් | **212,696,325.41** |

## 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සවිස්තරාත්මක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| 2013 රු | සටහන් | | 2014 රු. |
|---|---|---|---|
| | | අයභාර | |
| 237,029,000.00 | 1 | අනෙකුත් රාජ්‍ය අස්තිත්වයන්ගෙන් සංක්‍රාම ගෙවීම් | 365,347,000.00 |
| | | භාණ්ඩාගාර අක්මුදල් - ප්‍රාග්ධන | |
| 237,029,000.00 | | භාණ්ඩාගාර අක්මුදල් - පුනරාවර්තන | 365,347,000.00 |
| | | අමාත්‍යාංශ අක්මුදල් - පුනරාවර්තන | |
| | | අමාත්‍යාංශ අක්මුදල් - ප්‍රාග්ධන | |
| 13,948,205.53 | 2 | පොළී | 16,657,400.22 |
| | | රාජ්‍ය උගස් හා ආයෝජන බැංකුවේ ගෙවිය යුතු ආර්සී ,ආර්4 3% පොළී | |
| | | රු. 10,000.00 ලංකා බැංකු ස්වයං රැකියා ණය | |
| | | ණයදෙන ආයතනවල ආයෝජනවල ආයෝජනවලින් ලද පොළී | |
| 1,247,123.29 | | ලංකා බැංකුව | 945,972.60 |
| 1,956,978.08 | | මහජන බැංකුව | 720,123.29 |
| 306,181.55 | | නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | 31,143.09 |
| 24,041.10 | | හැටන් නැෂනල් බැංකුව | - |
| 200,000.00 | | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 200,000.00 |
| 1,857,534.08 | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 1,829,339.92 |
| 4,856,032.44 | | ලංකා බැංකුව - ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය | 5,379,870.00 |
| | | ලංකා බැංකුව - නිවාස ණය යෝජනා ක්‍රමය | 791,225.07 |
| 401,241.19 | | පාරිතෝෂික ආයෝජන සඳහා පොළී | 584,494.31 |
| | | සේවක ණය සඳහා පොළී | |
| 459,844.05 | | දේපළ ණය | 416,076.50 |
| 209,091.59 | | ආපදා ණය | 225,582.98 |
| 2,689.74 | | විශේෂ අත්තිකාරම් | 2,249.10 |
| 2,427,448.42 | | ඉතුරුම් ගිණුම් | 5,531,323.36 |
| **17,625.00** | | | **10,200.00** |
| 17,625.00 | | වෙනත් අයභාර | 10,200.00 |
| [71,853.21] | | | - |
| [71,853.21] | | අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන් ලද ලාභ/පාඩු | - |
| 250,922,977.32 | | මුළු අයභාර | 382,014,600.22 |
| | | වියදම් | |
| 27,833,773.22 | 3 | වැටුප්, වේතන හා වරප්‍රසාද | 33,149,376.84 |
| 12,786,075.79 | | කාර්ය මණ්ඩල වැටුප් | 13,891,926.54 |
| 2,450,236.87 | | සේවක අර්පසාධක අරමුදලට දායක මුදල් | 2,822,939.97 |
| 612,559.21 | | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක මුදල් | 705,767.49 |

| | | | |
|---|---|---|---|
| - | | විශ්‍රාමික දායකවීම් | - |
| 506,141.25 | | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 431,079.39 |
| 4,679,224.00 | | ජීවන වියදම් දීමනාව | 5,869,320.86 |
| 600,000.00 | | සභාපති දීමනාව | 600,000.00 |
| 480,000.00 | | ක්‍රියාකාරි අධ්‍යක්ෂ දීමනාව | 480,000.00 |
| 80,000.00 | | අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | 44,000.00 |
| 64,000.00 | | විගණන හා කළමනාකරණ කමිටු සාමාජික දීමනා | 44,000.00 |
| 48,000.00 | | අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් දීමනා | 48,000.00 |
| - | | ඉන්ධන හා දීමනා | 1,443,495.00 |
| 1,170,000.00 | | වාහන කුලියට ගැනීමේ වියදම් | 1,080,000.00 |
| 2,202,459.65 | | විශේෂ දීමනා | 2,702,898.45 |
| - | | වෙනත් දීමනා | 357,050.00 |
| 710,932.70 | | අනෙකුත් දීමනා | 751,333.47 |
| 96,739.73 | | භාෂා දීමනා | 101,373.34 |
| 1,347,404.02 | | පාරිතෝෂික දීමනා | 1,776,192.33 |
| 193,893,757.99 | 4 | ප්‍රදාන සහ වෙනත් සංක්‍රාම ගෙවීම් | 319,441,211.61 |
| | | මරණ හා තුවාල වන්දි | |
| 6,750,000.00 | | රජයේ සේවක | 1,200,000.00 |
| 88,264,000.00 | | සාමාන්‍ය මහජන | 148,739,750.00 |
| - | | සංස්ථා හා සමුපකාර සේවකයන් | - |
| - | | දේශපාලන පළිගැනීම් වලින් හානියට පත්වූවන් | - |
| - | | විශේෂ පුද්ගල | - |
| | | හානියට පත් දේපළ සඳහා වන්දි | |
| 41,761,645.00 | | රජයේ සේවක | 65,542,328.00 |
| 40,957,085.00 | | සාමාන්‍ය මහජන | 57,515,660.00 |
| 10,361,564.00 | | පූජනීය ස්ථාන | 20,007,312.00 |
| - | | විවාහ සමෘද්ධි දීමනා | 19,104,119.00 |
| 1,529,951.99 | | ණය සුපරීක්ෂණ වැඩසටහන | 1,361,427.06 |
| 739,228.80 | | ස්වයං රැකියාලාභී පුහුණු වැඩසටහන | 1,060,882.20 |
| 3,530,283.20 | | වන්දි ප්‍රදානය කිරීමේ උත්සව කටයුතු සංවිධානය | 4,909,733.35 |
| 3,539,902.33 | 5 | සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 1,450,410.29 |
| 1,037,592.78 | | ලිපිද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 947,955.39 |
| 2,310,194.55 | | ඉන්ධන හා ලිහිසි තෙල් | 331,585.00 |
| 79,380.00 | | නිල ඇඳුම් | 58,459.90 |
| 112,735.00 | | පුවත්පත් සහ සඟරා | 112,410.00 |
| 3,718,248.24 | 6 | ක්ෂයවීම් | 5,069,038.83 |
| 2,787,293.84 | | ක්ෂය - මෝටර් වාහන | 2,831,720.42 |
| 141,400.09 | | ක්ෂය - ලී බඩු, කාර්යාල උපකරණ හා සවි කිරීම | 431,527.91 |

| | | | |
|---|---|---|---|
| 116,196.00 | | ක්ෂය - කාමර වෙන් කිරීම් | 716,000.00 |
| 5,632.00 | | ක්ෂය - දුරකථන | 29,503.42 |
| 198,676.55 | | ක්ෂය - යන්ත්‍ර හා පිරියත | 151,471.34 |
| 258,290.58 | | ක්ෂය - පරිගණක | 491,736.02 |
| 210,758.88 | | ක්ෂය - වායු සමන යන්ත්‍ර | 417,079.72 |
| | 7 | ක්‍රමක්ෂය | 11,999,500.00 |
| | | ස්ථාවර නිවාස ආධාර | 11,999,500.00 |
| | 8 | **බොල් ණය** | **108,056,142.74** |
| | | රු. 200,000.00 ලංකා බැංකු බොල් ණය | 60,605,257.44 |
| | | රු. 10,000.00 ලංකා බැංකු බොල් ණය | 8,360,536.09 |
| | | රු. 200,000.00 ලංකා බැංකු බොල් ණය | 894,430.21 |
| | | ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පොළී | 38,195,919.00 |
| **2,639,710.10** | 9 | ස්ථාවර වත්කම් නඩත්තුව | **3,254,944.97** |
| 900,804.33 | | ස්ථාවර වත්කම් අලුත්වැඩියාව හා නඩත්තුව | 492,825.87 |
| 1,682,406.77 | | වාහන අලුත්වැඩියාව හා නඩත්තුව | 1,945,397.72 |
| 56,499.00 | | ගොඩනැගිල්ල නඩත්තු වියදම් | 471,026.00 |
| | | කාමර වෙන් කිරීමේ පාඩුව | 345,695.38 |
| 11,662,277.70 | 10 | වෙනත් වියදම් | 18,413,282.83 |
| 195,462.68 | | ගමන් වියදම් - දේශීය | 64,669.80 |
| 53,600.00 | | ගමන් වියදම් - විදේශීය | - |
| 475,711.31 | | දුරකථන ගාස්තු | 596,041.95 |
| 465,903.00 | | තැපැල් ගාස්තු | 457,800.00 |
| 1,002,031.96 | | විදුලිය බලය සහ අනෙකුත් පහසුකම් | 1,344,582.65 |
| 5,528,400.00 | | ගොඩනැගිලි කුලිය | 9,853,200.00 |
| 731,836.00 | | මුද්‍රණ වියදම් | 356,714.12 |
| 205,761.41 | | සංග්‍රහ වියදම් | - |
| 150,000.00 | | විගණන ගාස්තු | 184,656.00 |
| 151,500.00 | | සම්මන්ත්‍රණ, වැඩමුළු හා බඳවා ගැනීම් | 1,107,680.00 |
| 434,612.04 | | සේවකයන් සඳහා වෛද්‍ය රක්ෂණ | 670,282.55 |
| 1,019,615.93 | | විවිධ වියදම් | 95,551.12 |
| 320,404.45 | | සුභ සාධක වියදම් | 643,375.47 |
| 602,438.92 | | ජංගම හා දැනුවත් කිරීමේ වැඩසටහන | 1,220,608.17 |
| - | | අන්තර් අමාත්‍යාංශ හා අනෙකුත් | 916,015.00 |
| 325,000.00 | | නීති ගාස්තු | 589,866.00 |
| - | | පර්යේෂණය හා සංවර්ධනය | 312,240.00 |
| 216,980.58 | 11 | මූල්‍ය වියදම් | 442,505.87 |
| 216,980.58 | | බැංකු ගාස්තු - 8% වැට් බදු | 442,505.87 |
| | | ආයෝජන පොළී මත රඳවා ගැනීමේ බදු | |
| | | ජාතික සංවර්ධන බැංකු සඳහා පොළී | |
| 243,504,650.16 | | මුළු වියදම | 501,276,413.98 |
| **7,418,327.16** | | **කාල පරිච්ඡේදය සඳහා අතිරික්තය /ඌනතාවය** | **[119,261,813.76** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා සටහන්

| | | 2014 (රු) |
|---|---|---|
| ඒ | වෙනත් පුනරාවර්තන වියදම් | [375,770,385.23] |
| | පෞද්ගලික පඩිනඩි | [31,928,640.79] |
| | ගමන් වියදම් | [82,728.48] |
| | සැපයුම් | [1,658,296.63] |
| | නඩත්තුව | [2,806,399.55] |
| | ගිවිසුම්ගත සේවා | [14,891,425.38] |
| | වෙනත් පුනරාවර්තන වියදම් | [4,937,885.94] |
| | බලවත් සේ විපතට පත්වූවන් සඳහා වන්දි | [149,939,750.00] |
| | හානියට පත් දේපළ සඳහා වන්දි | [169,525,258.46] |
| බී | පොළී ආදායම | 15,377,023.34 |
| | 2014 වර්ෂය සඳහා ණයදෙන ආයතනවලින් ලද පොළී | 8,566,315.36 |
| | ණය යෝජනා ක්‍රම වලින් ලද පොළී | |
| | සේවක ණයවලින් ලද පොළී | 225,582.98 |
| | දේපළ ණයවලින් ලද පොළී | 416,076.50 |
| | විශේෂ අත්තිකාරම් වලින් ලද පොළී | 2,249.10 |
| | පාරිතෝෂික ආයෝජන සඳහා පොළී | 635,476.04 |
| | ඉතුරුම් ගිණුමෙන් ලද පොළී | 5,531,323.36 |
| සී | ණය අයකර ගැනීම් | 9,904,874.57 |
| | පාරිතෝෂික මුදල | 5,903,132.90 |
| | උත්සව අත්තිකාරම් | 265,500.00 |
| | සේවක ණය | 1,255,437.01 |
| | දේපළ ණය | 939,819.48 |
| | විශේෂ අත්තිකාරම් | 65,000.00 |
| | විවිධ තැන්පතු | 1,290,482.38 |
| | ලැබිය යුතු ලැබීම් | 185,502.80 |
| | පෙර වර්ෂවල ආදායම | |
| ඩී | ස්ථාවර වත්කම් මිලදී ගැනුම් | [7,416,490.71] |
| | රථ වාහන | [617,905.00] |
| | ලී බඩු, කාර්යාල උපකරණ හා සවිකිරීම් | [1,065,497.15] |
| | දුරකථන | [50,610.00] |
| | පරිගණක | [2,100,030.00] |
| | පරිගණක දත්ත පද්ධතිය | [2,688,000.00] |
| | යන්ත්‍රෝපකරණ | [206,628.56] |
| | වායු සමන යන්ත්‍ර | [232,000.00] |
| | කාමර වෙන් කිරීම් | [455,820.00] |

| | | |
|---|---|---|
| ඊ | කල්පිරුණු ආයෝජන ආපසු ගැනීම | 53,235,242.00 |
| | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | |
| | 2014 මාර්තු 05 | 421,000.00 |
| | 2014 අප්‍රේල් 07 | 634,000.00 |
| | 2014 අගෝස්තු 06 | 422,000.00 |
| | 2014 සැප්තැම්බර් 09 | 784,000.00 |
| | ලංකා බැංකුව | |
| | 2014 ජූලි 01 | 4,500,000.00 |
| | මහජන බැංකුව | |
| | 2014 පෙබරවාරි 05 | 15,000,000.00 |
| | 2014 අගෝස්තු 15 | 15,000,000.00 |
| | නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථාව | |
| | 2014 පෙබරවාරි 17 | 16,474,242.00 |
| එෆ් | ආයෝජන | [83,613,389.94] |
| | පාරිතෝෂික ආයෝජන | [10,766,893.70] |
| | උත්සව අත්තිකාරම් | [245,000.00] |
| | සේවක ණය | [2,265,534.69] |
| | විශේෂ අත්තිකාරම් | [65,000.00] |
| | විවිධ තැන්පතු | [1,980,287.68] |
| | පෙර ගෙවුම් | [290,673.87] |
| | ලංකා බැංකු නව ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය | [30,000,000.00] |
| | ලංකා බැංකු නව නිවාස ණය යෝජනා ක්‍රමය | [38,000,000.00] |
| ජී | කාල පරිච්ඡේදය ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන දෑ | 16,728,294.32 |
| | ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026495 | 869,378.32 |
| | ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026496 | 313,445.37 |
| | ලංකා බැංකුව - ඉතුරුම් ගිණුම් අංක 74757297 | 15,545,470.63 |
| එච් | කාල පරිච්ඡේදය අවසානයේදී මුද්ල සහ මුදල් සමාන දෑ | **1,502,868.35** |
| | ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026495 | 408,710.35 |
| | ලංකා බැංකුව - ජංගම ගිණුම් අංක 02026496 | 313,445.37 |
| | ලංකා බැංකුව - ඉතුරුම් ගිණුම් අංක 74757297 | 780,712.63 |

# 2014

## ජංගම නොවන වත්කම්

සටහන් නො 12-1

| | මෝටර් වාහන | ලී බඩු, කාර්යාල උපකරණ සහ සවි කිරීම | යන්ත්‍ර හා පිරියත | දුරකථන | කාමර වෙන් කිරීම | පරිගණක | වායු සමීකරණ |
|---|---|---|---|---|---|---|---|
| පිරිවැය<br>2014 ජනවාරි 01 දිනට ශේෂය | 15,701,570.00 | 3,001,027.27 | 794,706.20 | 176,473.00 | 3,214,840.00 | 2,132,066.00 | 1,796,163.50 |
| | - | 6,184,732.87 | 1,546,049.50 | 860,971.51 | - | 1,662,106.59 | 2,753,020.33 |
| ජර්නල් සටහන් නො.14 | - | [1,405,618.77] | [794,706.2] | [56,323.00] | - | [943,316.00] | [843,035.50] |
| වර්ෂය තුළ එකතු කිරීම | 617,905.00 | 1,065,497.15 | 206,628.56 | 48,835.00 | 455,820.00 | 2,096,840.00 | 232,000.00 |
| පරිගණක දත්ත සමුදාය වැඩසටහන | | | | | | 2,688,000.00 | |
| | 617,905.00 | 1,065,497.15 | 206,628.56 | 48,835.00 | 455,820.00 | 4,784,840.00 | 232,000.00 |
| ජර්නල් සටහන් නො.27 | | | | | [1,522,660.00] | | |
| ජර්නල් සටහන් නො.31 | 11,650,000.00 | | | | | | |
| ජර්නල් සටහන් නො.32 | [13,839,820.00] | | | | | | |
| 2014දෙසැම්බර් 31 දිනට ශේෂය | 14,129,655.00 | 8,845,638.52 | 1,752,678.06 | 1,029,956.51 | 2,148,000.00 | 7,635,696.59 | 3,938,148.33 |
| ක්ෂය කිරීම<br>2014 ජනවාරි 01 දිනට ශේෂය | 10,930,715.53 | 141,400.09 | 198,676.55 | 5,632.30 | 1,176,964.62 | 258,290.58 | 210,758.88 |
| ප්‍රත්‍යගණිත වත්කම්වල ක්ෂය අගය | | | | | | | |
| ජර්නල් සටහන් නො.15 | - | 4,576,203.90 | 1,240,354.08 | 740,418.88 | - | 1,037,966.83 | 2,161,205.44 |
| ජර්නල් සටහන් නො.16 | | 212,183.36 | 157,481.90 | 21,686.84 | - | 277,354.35 | 167,356.63 |
| ජර්නල් සටහන් නො.17 | | [140,561.88.] | [198,676.55] | [5,632.30] | - | [235,829.00] | [210,758.88] |
| ජර්නල් සටහන් නො.27 | | | | | [1,176,964.62] | | |
| ජර්නල් සටහන් නො.28 | | | | | 716,000.00 | | |
| ජර්නල් සටහන් නො.29 | | | | | [321,938.67] | | |
| ජර්නල් සටහන් නො.33 | [11,511,217.78] | | | | | | |
| වර්ෂය සඳහා වෙන් කිරීම | 2,831,720.42 | 431,527.91 | 151,471.34 | 29,503.42 | 321,938.67 | 491,736.02 | 417,079.72 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය | 2,251,218.17 | 5,220,753.38 | 1,549,307.32 | 791,609.14 | 716,000.00 | 1,829,518.78 | 2,745,641.79 |
| 2014 දෙසැම්බර් 31 දිනට ශුද්ධ පොත් අගය | 11,878,436.83 | 3,624,885.14 | 203,370.74 | 238,347.37 | 1,432,000.00 | 5,806,177.81 | 1,192,506.54 |

සටහන් අංක 13 -1

| 2014 දෙසැම්බර්31 දිනට ඒකාබද්ධ සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ණයදෙන ආයතනවලට ලබා දුන් අරමුදල් | | | | | | |
|---|---|---|---|---|---|---|
| ආයතනය | ලෙජර් පිටු අංක | නිවාස ණය | කර්මාන්ත ණය | ස්වයං රැකියා ණය | නව නිවාස ණය | එකතුව රු. |
| ලංකා බැංකුව | 38 ,43 | 5,000,000.00 | 31,000,000.00 | 570,487,000.00 | 108,991,000.00 | 715,478,000.00 |
| මහජන බැංකුව | 53 | 37,200,000.00 | | | | 37,200,000.00 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 51 | 120,952,000.00 | | | | 120,952,000.00 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 47 | 10,000,000.00 | | | | 10,000,000.00 |
| එකතුව | | 173,152,000.00 | 31,000,000.00 | 570,487,000.00 | 108,991,000 | 883,630,000.00 |

සටහන් අංක 13-2

2014 දෙසැම්බර් 31 දිනට ණයදෙන ආයතනවලින් ලැබිය යුතු පොළී

| ආයතනය | ලෙජර් පිටු අංක | ගණන රු. |
|---|---|---|
| ලංකා බැංකුව | 23 | 945,972.60 |
| මහජන බැංකුව | 25 | 720,123.29 |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | 33 | 38,195,919.00 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | 31 | 31,225.28 |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 29 | 178,270.84 |
| ලංකා බැංකු නව ණය ක්‍රමය | 36 | 6,171,095.11 |
| එකතුව | | 46,242,606.12 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. } JP/A/REPPIA/1/14/16 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 30 July 2015

සභාපති,
තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය.

**තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

---

තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1987 අංක 29 දරන තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය පනතේ 8(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7) ඒ වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2015 ජූනි 10 දින නිකුත් කරන ලදී.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.</u>

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම.

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන.

2.1. මතය.

මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට තැනැත්තන්, දේපල හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ මූල්‍ය තත්ත්වය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

### 2.2.1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති.

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 ට අනුව සම්පූර්ණයෙන් ක්ෂයකර අවසන්වූ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2. ගිණුම්කරණ අඩුපාඩු.

සමාලෝචිත වර්ෂයට අදාළව ගෙවිය යුතු රු.300,000 ක විගණන ගාස්තු ජංගම වගකීම් ලෙස දක්වනවා වෙනුවට ජංගම නොවන වගකීම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබුණි.

## 2.3. නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම.

පහත සඳහන් නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම. |
|---|---|
| (අ) 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 වන ඡේදය | කාර්ය මණ්ඩලයේ විවිධ ශ්‍රේණිවල රාජකාරි සඳහා භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.156,787 ක විශේෂ දීමනා ගෙවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. | |
| (I) මුදල් රෙගුලාසි 136 | වියදම් දැරීමට ප්‍රථම ඒ සඳහා විධිමත් පරිදි බලය ලබාගැනීම සිදුකල යුතු වුවද ඊට පටහැනිව අවස්ථා 10 කදී සුළු මුදල් අග්‍රිමයෙන් රු.850 සිට රු.8,596 ක පරාසයක ගෙවීම් සිදුකර තිබුණි. |
| (II) මුදල් රෙගුලාසි 371(2)(ආ),(ඇ) | (1) මාණ්ඩලික නිළධාරියෙකුට රු.20,000 ට නොවැඩි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ හැකි වුවත් එම සීමාවන් ඉක්මවා නිළධාරීන් හය දෙනෙකුට අවස්ථා 76 කදී රු.25,000 ක සිට රු.225,200 ක් අතර පරාසයක අත්තිකාරම් නිකුත් කර තිබුණි. |

(ii) තත්කාර්යය අතුරු අග්‍රිම දෙන ලද කාර්යය නිමකළ විගසම පියවිය යුතු වුවද අවස්ථා 40 කදී නිලධාරීන් 4 දෙනෙකු සඳහා දෙන ලද අත්තිකාරම් පියවීමට ප්‍රථම නැවතත් රු.5,000 සිට 125,000 අතර අත්තිකාරම් නිකුත් කර තිබුණි. තවද එකම කාර්යය සඳහා නිලධාරීන් දෙදෙනෙකුට තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබුණි.

(III) මුදල් රෙගුලාසි 385

රු.500 ට වැඩි සෑම ගෙවීමක්ම මුදලින් නොගෙවිය යුතු වුවද ඉන් බැහැරව අවස්ථා 12 කදී රු.7,000 සිට රු.59,620 දක්වා වූ පරාසයක ගෙවීම් සිදුකර තිබුණි.

(IV) මුදල් රෙගුලාසි 396 (ඈ)

නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.629,265 ක් වටිනා චෙක්පත් 18 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3. <u>මූල්‍ය සමාලෝචනය.</u>

3.1. <u>මූල්‍ය ප්‍රතිඵල.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රු.119,261,813 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.7,418,327 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.126,680,140 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

4. <u>මෙහෙයුම් සමාලෝචනය.</u>

4.1. <u>කාර්යසාධනය.</u>

අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් අවතැන් වූවන් පුනරුත්ථාපනය කිරීමට ණය ව්‍යාපෘති හතරක් යටතේ රු.735,000,000 ක ණය මුදලක් ප්‍රතිලාභීන් 4919 දෙනෙකු වෙත නිකුත් කිරීමට අරමුණු කර තිබුණද ප්‍රතිලාභීන් 516 ක් සඳහා පමණක් රු.79,649,000 ක ණය නිකුත් කර තිබුණි. අපේක්ෂිත ඉලක්කයන් හා සසඳන විට ණය නිකුත් කිරීම් ස්වයං රැකියා සඳහා සියයට 36 ක් ද, නිවාස සඳහා සියයට 44 ක් ද කර්මාන්ත සඳහා සියයට 25 ක් ද සමාජගත වූ අභ්‍යාසලාභීන් සඳහා ස්වයං රැකියා ණය සියයට 2 ක් ද වශයෙන් වූ අවම ප්‍රගතියක් අත්කර ගෙන තිබූ අතර ඒවායේ සමස්ත ණය නිකුත් කිරීමේ ප්‍රගතිය සියයට 11 පමණ වී තිබුණි.

## 4.2. කළමනාකරණ අකාර්යක්ෂමතා.

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ඒකාබද්ධ සහතාධාර යෝජනා ක්‍රමය යටතේ ණය පහසුකම් සැලසීම උදෙසා නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබාදී තිබූ මුදලින් ගිවිසුම් කාල සීමාව අවසන්ව තිබූ රු.මිලියන 120.2 ක ආයෝජන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) රට තුල සිදුවූ අභ්‍යන්තර ගැටුම් මත දේපල යථාවත් කිරීමට සහ ස්වයං රැකියා සඳහා 1983 වර්ෂයේදී ප්‍රතිලාභීන්ට ලබාදී තිබූ රු.76,631,093 ක ණය මුදල් මෙතෙක් අයවී නොතිබුණු අතර එය කපා හැරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් 2010 වර්ෂයේ නොවැම්බර් 09 දින ලබා තිබුණද ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයේ ලංකා බැංකුව මගින් 1983 ජූලි කලබල හේතුවෙන් ප්‍රතිලාභීන්ට ලබාදෙන ලද වාණිජ ණය රු.4,472,151 ක මුදලක් නැවත අයකර ගතයුතු කාලයද ඉකුත්ව තිබුණද ණය ආපසු අයවීම්වල ප්‍රගතිය අඩු මට්ටමක පැවතුණි.

(ඈ) 2009 වර්ෂයේ පනතුරට පත්වූ වාහනයක් වෙනුවෙන් ලැබියයුතු රු.44,300 ක වන්දි අයකර ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.

(ඉ) 2014 වර්ෂයේදී අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ල සඳහා විදුලි පරිපථයේ අළුත්වැඩියා සහ වෙනත් වියදම් සඳහා දරන ලද රු.74,056 ක මුදල් කුලී හිමියාගෙන් අයකරගෙන නොතිබුණි.

(ඊ) අධිකාරිය කලින් කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලෙන් ඉවත්ව වසරක කාලයක් ගතව තිබුණද බදුකුලී වෙනුවෙන් ගෙවා තිබූ රු.475,000 ක තැන්පතුව කුලී හිමියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(උ) පරිගණක දත්ත පද්ධතියක් අධිකාරිය තුළ ස්ථාපනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.2,688,000 ක් ගෙවීම්කර තිබුණද එම පරිගණක දත්ත ජාල පද්ධතිය තවමත් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.3. මතභේදයට තුඩුදෙන ගනුදෙනු.

සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලාභීන්ට වන්දි ගෙවීම සඳහා භාණ්ඩාගාරයෙන් රු.396,347,000 ක ප්‍රතිපාදන ලැබී තිබූ අතර එම ප්‍රතිපාදනයෙන් මරණ හා තුවාල සහ දේපල වන්දි ගෙවීම සඳහා රු.312,109,169 ක් වැයකර තිබුණි. ප්‍රතිලාභීන් සඳහා චෙක්පත් ප්‍රදානය කිරීමේ උත්සව වියදම් සහ ආහාර සඳහා රු.4,080,889 ක් ද ඉන්ධන ඇතුළු ප්‍රවාහන වියදම් සඳහා රු.828,844 ක් වැයකර එකී වියදම් වන්දි ගෙවීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. පෙර වර්ෂයේද මෙවැනි වියදම් සඳහා රු.3,082,589 ක වැය දරා තිබුණි.

## 4.4. ඌන උපයෝජිත වත්කම්.

අධිකාරියේ ස්ථාවර වත්කම් ගිණුම්ගත කිරීම සඳහා පමණක් පරිගණක වැඩසටහනක් ඇතුළත් මෘදුකාංගයක් 2009 වර්ෂයේදී මිලදී ගෙන තිබුණද එය අදාල කාර්ය සඳහා යවත්කාලීනව යොදාගෙන නොතිබුණි.

## 4.5. අනාර්ථික ගනුදෙනු.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය කුලියට ගෙන තිබූ කාර්යාල ගොඩනැගිල්ලට මාසික කුලිය (වැට් බදු රහිතව) රු.750,000 ක් වුවද, ඊට කලින් කුලියට ගෙන තිබූ ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය රු.425,000 ක් වීමෙන් කලින් ගොඩනැගිල්ලට වඩා සියයට 75 ක පමණ වූ කුලී ගෙවීම්වල වැඩිවීමක් නිරීක්ෂණය විය.

(ආ) අධිකාරියෙහි අනුමත ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් නොවූ දැයට කිරුළ වැඩසටහන සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,220,608 ක වියදමක් දරා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.

## 5.1. අභ්‍යන්තර විගණනය.

අධිකාරියේ අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපිත කර නොතිබුණු අතර, අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පවත්වන ලද විගණනයේදී අධිකාරියේ සියළු ගනුදෙනු ආවරණය කර නොතිබුණි.

6. <u>පද්ධති හා පාලනයන්.</u>

**විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයා වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.**

(අ). ගිණුම්කරණය.

(ආ). ස්ථාවර වත්කම්.

(ඇ). අයවැය පාලනය.

(ඈ). නිවාස ණය සහ වන්දි ආධාර ව්‍යාපෘති.

(ඉ). වන්දි ගෙවීම්.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**REP / AD / AUDIT / 2015** **2015.12.03**

විගණකාධිපති,

විගණකාධිපති දෙපාර්තමේන්තුව,

බත්තරමුල්ල.

**<u>තැනැත්තන්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ ව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 ( 2 ) ( සී ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද JP / A /REPPIA / 1 / 14 / 16 හා 2015 ජූලි 30 දිනැති වාර්තාව සම්බන්ධයෙන් මාගේ නිරීක්ෂණයන් පහතින් දක්වා ඇත.

**<u>2. මූල්‍ය ප්‍රකාශන</u>**

**2.2. <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**2.2.1.** 2015 වර්ෂයේ දී සියළු ම ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන කටයුතු තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සිදු කර ඇති අතර, අදාළ වාර්තාව තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් මේ වන විටත් ලබා දී නොමැත. තක්සේරු දෙපාර්තමේන්තුවෙන් අදාල වාර්තාව ලද විගස ම ඒ අනුව ගිණුම් හා ස්ථාවර වත්කම් ලේඛණය යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ.

**2.2.2 ගිණුම් කරණ අඩුපාඩු**

2015 වර්ෂයේ දී අවසාන ගිණුම මගින් නිවැරදි ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීමට කටයුතු කරමි.

**<u>2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නො වීම</u>**

( අ ) අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත් ව මසකට උපරිම දින 05 කට සීමා කර අදාළ ණය ක්‍රමය සඳහා ලබා ගන්නා 1% ක සේවා ගාස්තුව උපයෝගී කර ගනිමින් මෙම ගෙවීම් සිදු කරනු ලැබේ. ණය ක්‍රමයට අදාළ ක්ෂේත්‍ර රාජකාරිවල දුෂ්කරතාවය පමණක් සලකා බලා මෙම ගෙවීම් සිදු කරන ලදී. මේ වන විට අදාළ ගෙවීම අත්හිටුවා ඇත.

(ආ) (I) මු. රෙ. 136

ආයතනය සුළු මුදල් මගින් වියදම් දැරීමේ දී දැනට අධ්‍යක්ෂ මණ්ඩලය මගින් 2015 අපෙල් 21 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී රු. 5,000.00 ක උපරිමයකට යටත් ව සුළු මුදල් වියදම් දැරීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදි. ඒ අනුව රු. 20,000.00 ක සුළු මුදල් අත්තිකාරම පවත්වා ගෙනයාම ගිණුම් අංශය මගින් සිදු කරනු ලබයි. එය විධිමත් පරිදි ඒ ඒ අංශ විසින් අවශ්‍යතාවය මත සිදු කරනු ලබන ඉල්ලීම් පරිදි ගණකාධිකාරිවරයා විසින් සහතික කිරීමෙන් පසුව අදාළ මුදල් වියදම් කරනු ලැබේ.

(II) මු.රෙ. 371 (2)(අ), (ඇ)

(i) හා (ii)

උපරිම සීමාව වන රු. 20,000.00 ක සීමාව රාජකාරි වඩාත් එලදායි අයුරින් ඉටු කිරීමේ දී ප්‍රමාණවත් නො වේ. ඒ අනුව අවම වශයෙන් වන මුදල් අවශ්‍යතාව සැලකිල්ලට ගෙන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත් ව අත්තිකාරම් ලබා ගෙන ඇත. කෙසේ නමුත් ඉදිරියේ දී එම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත කළ ප්‍රමාණයට වඩා අත්තිකාරම් ලබා නො ගැනීමට ක්‍රියා කරමි. ප්‍රායෝගික තත්ත්ව සලකා බැලීමේ දී මෙම සීමාව තුළ කටයුතු කිරීම ඉතා අසීරු බව කාරුණික ව දන්වා සිටිමි. එසේ ම මේ වන විටත් ලබාගෙන ඇති එක් අත්තිකාරමක් නිරවුල් කිරීමට පෙර, තවත් අත්තිකාරමක් ලබා නො දීමට කටයුතු කර ඇත.

(III) මු.රෙ. 385

මෙහි දී සුළු මුදල් වියදම් ප්‍රමාණයට වඩා වැඩි මුදල් දැරීමේදී නිසි පරිදි චෙක්පත් මගින් ගෙවීම් කිරීමට කටයුතු කරනු ලබේ. එසේ ම අත්‍යාවශ්‍ය අවස්ථාවන්වල දී හැර අන් සෑම අවස්ථාවක දී ම චෙක්පත් මගින් අදාළ ගෙවීම් කිරීමට කටයුතු කරමි.

(IV) මු. රෙ. 396 (ඇ)

අදාළ මුදල් රෙගුලාසිය අනුව කටයුතු කර ඇත.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

නිරීක්ෂණ නිවැරදි ය.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යය සාධනය

(අ) ණය යෝජනා ක්‍රමයන්හි ප්‍රමාණවත් ප්‍රගතියක් නොමැති බවට වූ විගණන විමසුම

පුනරුත්ථාපනය වූ අභ්‍යාසලාභීන් සඳහා වූ ස්වයං රැකියා ණය ක්‍රමයේ දෙවන අදියර සඳහා රුපියල් මිලියන 525 ක ප්‍රමාණය 2014 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කර තිබුනද එවකට පැවති බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා පුනරුත්ථාපන අමාත්‍යාංශය යටතේ එම දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා සියලුම සැලැස්ම සකස් කර අදාල බැංකු ආයතන සමඟ සාකච්ඡා කර එම ආයතනවල එකඟතාවය ද ලැබී තිබුන. එසේම ඒ ඒ බැංකු ආයතන මගින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රමාණයන් පහත පරිදි දැක්වේ.

| | |
|---|---|
| මහජන බැංකුව | 175 මිලියන |
| ලංකා බැංකුව | 175 මිලියන |
| ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 75 මිලියන |
| ලංකා පුත්‍ර බැංකුව | 100 මිලියන |

කෙසේ නමුත් අදාල බැංකු ආයතන සමඟ ගිවිසුම් අත්සන් කිරීම සඳහා කෙටුම්පත් සකස් කර යොමු කරන ලද අතර, 2014 වර්ෂය අවසාන වන තෙක් බැංකු ආයතන මගින යහපත් ප්‍රතිචාරයක් දක්වා නොතිබුනි.

කෙසේ නමුත් 2015 වර්ෂය ආරම්භයේදී පවත්නා රජය වෙනස් වීම හේතුවෙන් භාණ්ඩාගාර අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන හා මූල්‍ය) සමඟ සාකච්ඡාවේදී එතුමන් අප වෙත දැනුම් දෙන ලද්දේ නව රජයේ අමාත්‍ය මණ්ඩලයද වෙනස් වූ බැවින් නැවත කැබිනට් පත්‍රිකාවක් යොමු කර අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලෙසයි. පසුව අදාල කැබිනට් අනුමැතිය 2015 වර්ෂයේ පෙබරවාරි මස ලැබුනි.

ඉන් අනතුරුව අදාල අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡාවේදී තීරණය වූයේ භාණ්ඩාගාර ලේඛය හා බැංකු ප්‍රධානීන් හා සභාපතිවරුන්ගේ සහභාගීත්වයෙන් රැස්වීමක් සංවිධානය කොට මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා තීරණය කල යුතු බවයි. නමුත් මේ වන විටත් භාණ්ඩාගාර හා අදාල බැංකු ආයතන එම සාකච්ඡාව සඳහා දිනයකක් දී නොමැත. කෙසේ නමුත් මුදල් අමාත්‍යාංශයේ උපදේශක පාස්කර ලිංගම් මහතා වෙත මෙම ඉල්ලීම යොමු කර ඇති අතර අදාල සාකච්ඡා කිරීම සඳහා බලාපොරොත්තු වෙමි.

## නිවාස ණය යෝජනා ක්‍රමය

2014.01.01 දින වන විට නිවාස ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් ලංකා බැංකුව සතුව පැවති අරමුදල් ප්‍රමාණය රුපියල් මිලියන 12 කි. 2014.09.15 දිනැති ව අමතර රුපියල් මිලියන 28 ක් ලබාදෙන ලදී. ඒ අනුව 2014 වර්ෂය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමය වෙනුවෙන් ප්‍රයෝජනයට ගත හැකි සම්පූර්ණ මුදල වූයේ මිලියන 40 කි. එම මුදල වෙනුවෙන් ප්‍රතිලාභීන් 176 ක් නිර්දේශ කරන ලද අතර එහි වටිනාකම රුපියල් 39,750,000 විය. නමුත් බැංකුව විසින් නිදහස්කර තිබුනේ රු.17,700,000 ක් පමණි. එය ප්‍රතිශතයක් ලෙස 44% කි. ඒ අනුව 2014.09.15 දින ලබාදුන් මුදලින් මාස 3 ක් වැනි කෙටි කාලයක් තුළදී සම්පූර්ණ මුදල ම ණය ලෙස ලබාදීමට අදාළ බැංකුවට ප්‍රමාණවත් කාලසීමාවක් නොවීම හේතුවෙන් ඉහත කී තත්ත්වය උද්ගතවී ඇත. ඉදිරියේ දී එම තත්ත්වය වලක්වාලීම සඳහා පූර්ව ණය සුපරීක්ෂණ වැඩසටහනක් හඳුන්වා ඇති අතර එමගින් සතුටුදායක ප්‍රගතියක් වාර්ථා කර ඇති බව දක්වනු කැමැත්තෙමි.

## ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය

2014 ක්‍රියාකාරී සැලැස්ම අනුව ස්වයං රැකියා ණය ක්‍රමය යටතේ ප්‍රතිලාභීන් 1000 ක් වෙනුවෙන් රුපියල් මිලියන 100 ක් ණය නිදහස් කිරිමට අපේක්ෂා කළද , ණය ලබාදීමට හැකියාව ලැබුණේ ප්‍රතිලාභීන් 434 ක් සඳහා මිලියන 58.04 ක් පමණි. ඊට හේතු වූයේ ණය අයකර ගැනීමේ දුෂ්කරතා හා ණය සඳහා ඇපකරුවන් පිළිබඳ දැඩි ක්‍රියාමාර්ග අනුගමනය කිරීම ආදී කරුණු හේතුවෙන් මෙම තත්ත්වය උද්ගතවී ඇත. කෙසේ නමුත් පුනරුත්ථාපන අධිකාරිය 2014 වසර තුළ ප්‍රතිලාභීන් 2353 ක් සඳහා රු.324,210,000 ක මුදලක් බැංකුව වෙත නිර්දේශ කර තිබුණි.

එම වසරේ ප්‍රගතිය පහළ මට්ටමක පවතින බව පිළිගන්නා අතර ඒ සඳහා ප්‍රතිකර්මයක් ලෙස පූර්ව ණය සුපරීක්ෂණ වැඩසටහන (pre-supervision ) 2014 දෙසැම්බර් මාසයේ සිට හඳුන්වාදී ඇත. එය මේ වනවිට සාර්ථක ප්‍රතිඵල අත් කරගෙන ඇති අතර 2015 ජනවාරි සිට අප්‍රේල් මාසය වනවිට ණය ලිපිගොනු 280 ක් සඳහා ණය මුදල ලෙස රු.41,118,000 ක් නිදහස් කොට ඇත.

මේ සම්බන්ධයෙන් ලංකා බැංකුවේ මහා කළමණාකරු සමග සාකච්ඡා කළ අතර ණය නිදහස් කිරීමේ ප්‍රමාදය වලක්වා ගැනීමට ඉදිරියේ දී අවශ්‍ය පියවර ගෙන ඇත.

කර්මාන්ත ණය යෝජනා ක්‍රමය

කර්මාන්ත ණය ක්‍රමය යටතේ 2014 ක්‍රියාකාරී සැලැස්මට අනුව රුපියල් මිලියන 10 ක් වෙන් කර තිබුණි . මේ සඳහා ණය නිර්දේශ ලබා දී තිබූ අතර 2014 වසර තුළදී එක් ණයක් නිදහස් කළ අතර එහි වටිනාකම රු.2,500,000 කි. එසේ ම 2014 දෙසැම්බර් මාසයේ නිර්දේශ කළ එක් කර්මාන්ත ණයක් වෙනුවෙන් 2015 පෙබරවාරි මස රුපියල් මිලියන 5 ක මුදලක් මුදාහැර තිබුණි.

ඒ අනුව කර්මාන්ත ණය ක්‍රමය යටතේ ඉතිරි ව ඇති මුදල රු.මි 2.5 ක් වන අතර එම මුදල සඳහා මේ වන විට ණය නිර්දේශයක් ලබාදී ඇත. එය මෙම වර්ෂය ඇතුළත නිදහස් කිරීමට හැකිවේ යැයි සිතමි.

(ආ) මේ වන විට විධිමත් පරිදි **Surver** යන්ත්‍රය ස්ථාපිත කර පරිගණක දත්ත පද්ධතිය සකස් කර යාවත්කාලීන කරමින් පරීක්ෂණ මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ. කෙසේ නමුත් ප්‍රමාණවත් ප්‍රගතියක් වාර්ථා කර ඇත.

4.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

(අ) පුනරුත්ථාපන අධිකාරිය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද නිවාස ණය වැඩ පිළිවෙල යටතේ රු.මිලියන **128** ක මුදලක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දී ඇත.

මෙම මුදල සඳහා ගිවිසුම් අනුව කාලය සම්පූර්ණ වුව ද එය ආපසු නො ගෙවීම සම්බන්ධයෙන් **2011** ජුනි **29** දිනැති ව පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී සාකච්ඡා විය.

එහි තීරණය වූයේ අයවිය යුතු පොළී මුදල කපා හැර හෝ ආයෝජිත මුදල ලබා ගැනීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ය.

ඒ අනුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කොට අදාළ මුදල් ලබා ගැනීමට මුල දී කටයුතු කරන ලදි. ඒ අනුව රුපියල් මිලියන **128** ක මුදලින් මේ වන විට පුනරුත්ථාපන අධිකාරිය වෙත ආපසු ලබා දී ඇති ණය අයකිරීම් පහත පරිදි වේ.

| | |
|---|---|
| **2011.04.07** | **421,000.00** |
| **2011.06.29** | **515,000.00** |
| **2011.09.22** | **375,000.00** |

| | |
|---|---|
| 2011.11.01 | 337,000.00 |
| 2011.12.30 | 339,000.00 |
| 2012.03.12 | 284,000.00 |
| 2012.04.17 | 205,000.00 |
| 2012.06.15 | 376,000.00 |
| 2012.09.10 | 545,000.00 |
| 2013,01.31 | 426,000.00 |
| 2013.02.20 | 155,000.00 |
| 2013.09.05 | 809,000.00 |
| 2014.03.05 | 421,000.00 |
| 2014.03.28 | 634,000.00 |
| 2014.08.06 | 422,000.00 |
| 2014.09.09 | 784,000.00 |
| 2015.02.16 | 745,000.00 |
| 2015.05.19 | 317,000.00 |
| 2015.08.13 | 175,000.00 |
| එකතුව | 119.715.000.00 |

මේ අනුව ලැබිය යුතු ශේෂය 8,285,000.00 මුදලක් මේ වන විට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ලැබී ඇත.

ඉහත ආකාරයට අදාළ මුදල් ආපසු ලබා ගැනීමට දීර්ඝ කාලයක් ගත වන බැවින් දැනට පුනරුත්ථාපන අධිකාරිය හා ලංකා බැංකුව මගින් ක්‍රියාත්මක කරන නිවාස ණය වැඩ සටහන තවදුරටත් පුළුල් කරමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සමහ ඉහත ගෙවීමට ඇති ඉතිරි මුදල යොදා ගනිමින් නිවාස ණය වැඩසටහනක් ක්‍රියාවට නැංවීමට මූලික කටයුතු සැලසුම් කර ඇත. මේ පිළිබඳව සාකච්ඡාවක් 2012.11.02 දිනැති ව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා සමහ පවත්වන ලදි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් අප වෙත ඒකාබද්ධ නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ මේ දක්වා ලබා දීමට ඇති හිඟ මුදල රු.120,207,000.00 ක් වන අතර මේ පිළිබඳ ව එම ආයතනය වෙත අවස්ථා කිහිපයක දී දැනුම් දී ඇත. තවද නව ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා 2010.12.10 දිනැති ව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබිණි.

මේ පිළිබඳව 2012.11.15 දින පැවති පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) උපදෙස් පරිදි නිවාස සංවර්ධන අධිකාරියෙන් පුනරුත්ථාපන අධිකාරියට අය විමට ඇති මුදල උපයෝගී කර ගනිමින් ඒකාබද්ධ ණය වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණ ද ඒ සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ එකඟත්වය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් හෝ යම් යහපත් ප්‍රතිචාරයක් මේ දක්වා ලැබී නොමැත.

මේ සම්බන්ධයෙන් නිවාස අමාත්‍යාංශය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය දිගින් දිගටම දැනුම්වත් කරන ලදී. නමුත් මේ දක්වාම සාර්ථක ප්‍රතිචාරයක් ලැබී නොමැත.

කෙසේ නමුත් නිවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා ඇතුළු ඉහළ නිලධාරීන් සමඟ 2015.10.12 දින පැවැත් වූ පුනරුත්ථාපන අධිකාරියේ සභාපති ඇතුළු මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ රුස්වීමේ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ මතය වූයේ දැනට අළුත් ණය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ එකවර අදාළ මුළු මුදල ගෙවීමට අපහසු බව යි. එසේම විටින් විට ණයලාභීන්ගෙන් අයකර ගන්නා මුදල් පුනරුත්ථාපන අධිකාරිය වෙත ලබාදීමට කටයුතු කරන අතර ඉදිරියේ දී මෙම මුළු මුදල අධිකාරිය වෙත ලබාදීම සඳහා භාණ්ඩාගාරය මගින් පහසුකම් සලසා ගැනීමට ලිඛිතව ඔවුන් දැනුවත් කිරීමට කටයුතු කරන බවත් ඔවුන් ප්‍රකාශ කරන ලදී.

එබැවින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දුන් අරමුදලේ හිඟ මුදල් අයකර ගැනීම සඳහා විගණන හා කළමනාකාර කමිටු රුස්වීමේ තීරණය අනුව මේ වන විට නිවාස අධිකාරිය සමඟ සාකච්ඡා පවත්වමින් සිටින අතර 2011 COPE කමිටු වාර්තාව අනුව අයකර ගැනීමට අදාළ මුදල නව නිවාස ණය ක්‍රමයක් සඳහා යෙදවීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තව දුරටත් එකඟ නො වන්නේ නම් එම මුදල සහ අයවිය යුතු පොලිය අයකර ගැනීමට නීත්‍යානුකූලව පියවර ගන්නා බව කාරුණික ව දන්වා සිටිමි.

(ආ) උක්ත වර්ෂයේ දී මෙම මුළු මුදල් ප්‍රමාණය සඳහා ම අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර ඇත. මුදල් රෙගුලාසි ප්‍රකාර ව භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලද විගස අදාළ ශේෂය ගිණුම් මගින් කපා හැරීමට කටයුතු කරමි. 2015 වර්ෂයේ දී පැවති කෝප් කමිටු රුස්වීමේ දී මේ පිළිබඳ ව සාකච්ඡාවට භාජනය වූ අතර, ඒ පිළිබඳව ඉදිරි කටයුතු කරන බව දැනුම් දෙන ලදී.

(ඇ) උක්ත ණය මුදල් අයවීම ඉතා මන්දගාමී අයුරින් සිදුවන අතර, 2015 ජනවාරි මාසයේ දී මෙම මුදලින් සුළු ප්‍රමාණයක් අය වී ඇත. කෙසේ නමුත් 2014 වර්ෂයේ අධිකාරියේ අවසන් ගිණුම් මගින් මෙම ණය මුදල සඳහා 20% ක අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර ඇත. කෙසේ නමුත් ණය අයකරගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන ඇත.

(ඇ) අදාළ වාහනය අනතුරට ලක්වීමෙන් පසු අලුත්වැඩියාව සඳහා ගරාජය වෙත යොමු කළ අතර ගිණුම්වල සටහන් වන්නේ ගරාජය මගින් අලුත්වැඩියාවන් සඳහා වැය වන මුළු මුදල යි. එම මුදල අයකර ගැනීමට රක්ෂණ සමාගම වෙත යොමු කළ අතර රක්ෂණ සමාගම විසින් ආයතනය වෙත ප්‍රතිපූර්ණය කර ඇත්තේ රු. 44,300.00 ක් අඩුවෙනි. මෙම හේතුව නිසා මෙකී මුදල රක්ෂණ සමාගම කිසිසේත් ම අප වෙත ගෙවීමට බැදියාවක් නැත. මෙම කරුණු ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පත්‍රිකාවක් යොමු කල අතර අනුමැතිය ලද වහා ම ඒ අනුව කටයුතු කරමි. අධ්‍යක්ෂ මණ්ඩලයට කරුණු දැක්වීමෙන් අනතුරුව අදාල වියදම කපා හැරීම සඳහා අනුමැතිය ලැබී ඇත.

(ඉ) අදාළ මුදල කුලී හිමියාගෙන් අයකර ගත යුතු වියදමක් නො වන අතර එම මුදල ආයතනය සඳහා විදුලිය ලබා ගැනීම වෙනුවෙන් විදුලිබල මණ්ඩලය හා කොළඹ නගර සභාව වෙත ආයතනය නමින් තැන්පත් කර ඇති, නැවත ලබාගත හැකි තැන්පතුව කි. මින් කොළඹ නගර සභාව වෙත තැන්පත් කර ඇති රු. 8,912.25 ක තැන්පත් මුදල 2015.07.09 දින අංක. 406966 දරණ චෙක්පත මගින් අප වෙත ලබා දී ඇත. කෙසේ නමුත් විදුලිබල මණ්ඩලයේ ඇති රු. 65144.00 ක තැන්පතු මුදල අප ආයතනය වෙනත් ස්ථානයක් වෙත රැගෙන යන අවස්ථාවේ දී ලබා දීමට කටයුතු කරන බව ගිවිසුම් ප්‍රකාරව සඳහන් වේ.

(ඊ) අදාළ ගොඩනැගිල්ල වෙනුවෙන් අයකර ගැනීමට ඇති මුදල සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ඔස්සේ විසඳුමකට එළඹීමට පියවර ගනිමින් පවතී.

(උ) මේ වන විට විධිමත් පරිදි Server යන්ත්‍රය ස්ථාපිත කර පරිගණක දත්ත පද්ධතිය සකස් කර යාවත්කාලීන කරමින් පරීක්ෂණ මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රමාණවත් ප්‍රගතියක් අත්කරගෙන ඇත.

## 4.3 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

(අ) ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් වන්දි ප්‍රදානය කිරීමේ උත්සව පැවැත්වීමත්, ඒ ඒ දිස්ත්‍රික්කවල විෂය භාර අමාත්‍යතුමන්ගේ ප්‍රධානත්වයෙන් වන්දි ප්‍රදානෝත්සව පැවැත්වීමත් සඳහා අදාළ වියදම් දැරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීමේ දී ගැටළු සහගත තත්ත්වයක් පැවතීම හේතුවෙන් 2014 වර්ෂයට අදාළ ව අයවැය යෝජනා පිළිබඳ ව වූ සාකච්ඡාවේ දී කරුණු පැහැදිලි කිරීමෙන් අනතුරු ව, මහා භාණ්ඩාගාරය වෙනුවෙන් එම සාකච්ඡාව සඳහා සහභාගී වූ නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් දැනුම්වත් කිරීමෙන් අනතුරු ව එකී වියදම්

වන්දි සඳහා ලබාදෙන ප්‍රතිපාදන මගින් දැරීමට කටයුතු කරන බවට දන්වන ලදි. එකී වියදම් ද ඇතුළත් කර 2014 වර්ෂයේ සංශෝධිත අයවැය ඇස්තමේන්තුව අමාත්‍යාංශ ලේකම්වරයා මගින් භාණ්ඩාගාරය වෙත යොමු කර ඇත. එමෙන් ම මෙය වන්දි ගෙවීම් සඳහා අදාළ වියදම් වේ.

**4.4 ඌණ උපයෝජිත වත්කම්**

ආයතනයේ නිලධාරීන් කිහිපවිටක දී මෙම මෘදුකාංග භාවිත කළ අතර අදාළ මෘදුකාංග භාවිත කළ නිලධාරීන් මේ වන විට සේවා ස්ථානයෙන් ඉවත් වී ඇත. ඊට අමතර ව දැනට සිටින නිලධාරීන් මෙම මෘදුකාංගය භාවිත කිරීම සඳහා Science Land ආයතනයෙන් නැවත විමසීම් කරණ ලදි. කෙසේ වෙතත් පවතින ක්‍රමය හා මෘදුකාංග භාවිතය පිළිබඳ ව ගැටළු මතු වී ඇති බැවින් ඒ පිළිබඳ ව 2009 වර්ෂයේ දී මෘදුකාංගය මිල දී ගෙන ඇති Science Land ආයතනය සමඟ සාකච්ඡා කර ඉහත මෘදුකාංගය භාවිත කිරීමට පියවර ගනිමි.

**4.5 අනාර්ථික ගණුදෙනු**

(අ) පුනරුත්ථාපන අධිකාරි කාර්යාලයය සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති බැවින් 2009 වර්ෂයේ සිට පහසුකම් සහිත ගොඩනැගිල්ලක් ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන ලදි. 2007.08.14 විගණකාධිපති විසින් ඉදිරිපත් කර ඇති විගණන විමසුම මගින් ද ප්‍රමාණවත් පහසුකම් නොමැති බවට පෙන්වා දෙන ලදි.

ඊට අමතර ව අංක 95, ආනන්ද රාජකරුණා මාවත, කොළඹ 08 පිහිටි ගොඩනැගිල්ලේ ඉඩපහසුකම් පුළුල් කිරීම සඳහා අයිතිකරුගෙන් ඉල්ලීම් ද කරනු ලැබීය. අයිතිකරු විසින් එම ඉල්ලීම ද ඉවත දමන ලදි. කෙසේ නමුත් එකී ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය 6500 ක් පමණි.

ආයතනයේ සේවක සංඛ්‍යාව මෙන් ම වැඩ කටයුතු පුළුල් වීමත් සමඟ පවත්නා ගොඩනැගිල්ලේ ඉඩ ප්‍රමාණවත් නො වූ අතර, ඊට අමතර ව එම ගොඩනැගිල්ල සඳහා මාසික කුලිය ද වැඩි කිරීම් කළ අතර, ගොඩනැගිල්ලේ අයිතිකරු විසින් අදාළ මුදල් ගෙවීම් කිරීමට නො හැකි නම් වෙනත් ස්ථානයක් සොයා ගන්නා ලෙස නීතිඥ මහතෙකු මගින් දැනුම් දීම් කරන ලදි.

(ඇ) වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට අනුකූල වන පරිදි සියළු ම අංශයන් ආවරණය වන සේ ක්‍රියාත්මක අභ්‍යන්තර පාලනයක් මගින් වියදම් සීමා කරමින් අයවැය පාලනයකින් යුතු ව පවත්වාගෙන යාමට කටයුතු කරනු ලැබේ.

(ඇ) නිසි පරිදි කටයුතු කිරීමට නිලධාරීන් දැනුම්වත් කර ඇත.

(ඉ) වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවට අනුකූල ව වනාදි ගෙවීමට කටයුතු කරනු ලැබේ.

එස්. පත්මනාදන්.

සභාපති,

පුනරුත්ථාපන අධිකාරිය.

1. විගණන අධිකාරී, රජයේ විගණන අංශය, බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 03.
2. ප්‍රධාන අභ්‍යන්තර විගණක. - පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය.